# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන 36 වැනි කාණ්ඩය 2023 ජූනි



## ඉදිරි අභියෝගාත්මක කාලය ජය ගැනීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම සහය අපේක්ෂා කරනවා - කාර්ය මණ්ඩලය අමතමින් නව මහලේකම්වරිය පවසයි



# අන්තර්ගතය

## පුවත්

- ඉදිරි අභියෝගාත්මක කාලය ජය ගැනීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම සහය අපේක්ෂා කරනවා - කාර්ය මණ්ඩලය අමතමින් නව මහලේකම්වරිය පවසයි
- පාර්ලිමේන්තුව විදිහට පසුගිය කාල සීමාවේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව ආරක්ෂා කරගන්න ක්‍රියාමාර්ග රැසක් දියත් කළා -පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර.
- පාර්ලිමේන්තු සංවර්ධනය පිලිබඳ ජාත්‍යන්තර විශේෂඥ කෙවින් ඩෙවෝක් මහතා කථානායකතුමා හමුවෙයි.
- රත්නපුර කුඩා ජේසු බිළිඳාගේ කන්‍යාරාම ජාතික පාසලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුව උත්කර්ෂවත් අයුරින් පැවැත්වේ.
- රුමේනියානු රාජ්‍ය ලේකම්වරයා කථානායකවරයා හමුවෙයි.
- පාර්ලිමේන්තු මහලේකම් ධූරයට පත් වූ කුෂානි රෝහණදීර මහත්මියට ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිනිය ජූලි චංග් මහත්මිය සුබ පතයි.
- රේගු ක්‍රියාවලියේ පවතින ගැටලු සහ දුර්වලතා හඳුනාගැනීමට ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව ශ්‍රී ලංකා රේගු මූලස්ථානය ඇතුළු පරිශ්‍රයන්හි නිරීක්ෂණ චාරිකාවක.

## කාරක සභා පුවත්

- 2019 වර්ෂයේදී රුපියල් බිලියන 34ක් වැයකොට අධ්‍යාපන අමාත්‍යාංශය මිලදීගත් ටැබ් පරිගණක හා ආරෝපිත රාක්ක පළදායී ආකාරයෙන් යොදවා නොමැති බව කෝපා කමිටුවේදී අනාවරණය වේ.
- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගැටලු රැසක් කෝපා කමිටුවේදී අනාවරණය වෙයි.
- කොළඹ මහා නගර සභාවේ 2022 වර්ෂයේ හිඟ ආදායම රුපියල් මිලියන 6280 ක් - කෝපා කමිටුවේදී අනාවරණය වෙයි.
- මාධ්‍ය හමුව නිසා විගණකාධිපතිවරයා සහ කෝප් කමිටුව සම්බන්ධයෙන් වැරදි අදහසක් සමාජගතවූයේ නම් සමාව ඉල්ලා සිටින බව හූ විද්‍යා සහ පතල් කැනීම් කාර්යංශය කෝප් කමිටුව හමුවේ පවසයි.
- සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පරිපාලන දුර්වලතා රැසක් කෝප් කමිටුවේදී අනාවරණය වෙයි.
- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීම පැවැත්වේ.

# අන්තර්ගතය

- පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය.

- අන්තර්ජාලය ඔස්සේ සිදුකරන දෙස් විදෙස් ව්‍යාපාර නියාමනය කරන නිසි යාන්ත්‍රණයක් අත්‍යවශ්‍යයි - ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා වන කාරක සභාවේදී අවධාරණය කෙරේ.

- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අමාත්‍යාංශය මැදිහත් වී ණය පහසුකම් ලබා දීමේ කටයුතු කඩිනම් කිරීමට බැංකු සමග අවශ්‍ය පියවර ගන්නවා- කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ.

- පවතින සංකීර්ණ නීති වෙනුවට මෙරට ආයෝජන සම්බන්ධයෙන් නව පනතක් මේ වසර අවසන් වන විට ගෙනෙනවා - රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම.

- මන්ත්‍රීවරු සමග සාකච්ඡා නොකර පළාත් පාලන සීමා නිර්ණය ගැන අවසන් තීරණයක් ගන්නේ නැහැ.

- ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ විශේෂ ඒකකයක් පිහිටුවීමට පියවර -අධ්‍යාපන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කෙරේ-

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ.

- නැනෝ යූරියා පොහොර භාවිතය මගින් නිර්දේශිත යූරියා පොහොර ප්‍රමාණය 25%-50% අතර ප්‍රමාණයකින් අඩු කරගත හැකියි - ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය වෙයි.

- ඉතිහාසයේ ප්‍රථම වතාවට පෞද්ගලික අංශය ද අල්ලස් ගැනීමේ වරදක් සිදු කළහොත් දූෂණ මර්දන පනත් කෙටුම්පත යටතේ දඬුවම්ලබා දිය හැකියි - යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා වෙයි.

- වාහන ආනයනය නැවතීම ඇතුළු භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන් අයවැයෙන් අපේක්ෂාකරන ආදායමට ළඟාවීමට ශ්‍රී ලංකා රේගුවට නොහැකියි- ශ්‍රී ලංකා රේගුව.

- මහා පරිමාණ මත්පැන් නිෂ්පාදන සමාගම්වලින් අය විය යුතු බදු මුදල් අයකරගැනීමට ඉක්මනින් කටයුතු කරන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

- රාජ්‍ය ආයතන අකාර්යක්ෂම වීම වළක්වා ගැනීම සහ රාජ්‍ය ආයතන හා ජනතාව අතර ඇති දුරස්ථභාවය තුරන් කිරීම පිළිබඳ විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ.

- පාසැල් දරුවන් වෙනුවෙන් විද්‍යුත් තැපෑල (E-mail) ගිණුම් සැකසීමේදී දෙමවුපියන්ගේ දත්ත ඇතුළත් කරන්න එපා - පොලිස් අපරාධ අංශයේ නිලධාරීහු පාර්ලිමේන්තු කාරක සභාවේදී පවසති.

කවරයේ කතාව ජායා ගැලරිය

# කවරයේ කතාව



## ඉදිරි අභියෝගාත්මක කාලය ජය ගැනීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම සහය අපේක්ෂා කරනවා - කාර්ය මණ්ඩලය අමතමින් නව මහලේකම්වරිය පවසයි

පැමිණෙන විවිධ අභියෝග මැද මේරටේ උත්තරීතරම ආයතනයක් වන පාර්ලිමේන්තුවේ කටයුතු උපරිම කාර්යක්ෂමතාවකින් ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම උපරිම සහය අපේක්ෂා කරන බව පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය පසුගියදා පැවසුවාය.

ධුරයට පත්වීමෙන් පසු ප්‍රථමවරට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය අමතමින් මේ මස 13 වැනිදා ඇය මේ බව ප්‍රකාශ කළාය.

විශේෂයෙන් අත්දැකීම් බහුල පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් ඉදිරි වසර කිහිපය තුළ විශ්‍රාම යාමට නියමිත බැවින් ඇතිවන තත්ත්වයන් කලමනාකරණය කරමින් උපරිම සේවයක් ලබාදීමේ අවශ්‍යතාව ඇය පෙන්වා දුන්නාය.



# පුවත්

## පාර්ලිමේන්තුව විදිහට පසුගිය කාල සීමාවේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව ආරක්ෂා කරගන්න ක්‍රියාමාර්ග රැසක් දියත් කළා - පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් පසුගිය කාල සීමාව තුළ ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කළ බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය පැවසුවාය.

ඒ අතරින් 2018 වසරේ දී පළ කළ සංශෝධිත ස්ථාවර නියෝගවල ඉතාම මධ්‍යස්ථ ඇඟවුම් කාරක සහිත වචන ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිරූපණය කිරීමට භාවිතා කිරීම සුවිශේෂී ක්‍රියාමාර්ගයක් බව ඇය තවදුරටත් පෙන්වා දුන්නාය.පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය මගින් ද කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන අසාධාරණකම් පිළිබඳ නිතර හඬ නගන බවත් ඒ පිළිබඳව සාධනීය මැදිහත් වීම් ඔවුන් විසින් සිදු කරන බවත් මහ ලේකම්වරිය සඳහන් කළාය.

ඒ මහත්මිය මේ බව සඳහන් කළේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ සමාජ අන්තර්කරණය පිළිබඳ සංවේදී සහ මාධ්‍ය වාර්තාකරණය පිළිබඳ වැඩමුළුවකට මේ මස 27 වැනිදා සහභාගී වෙමිනි.

මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ මහ ලේකම්තුමිය "මේ සියලු දේ කරන්නේ අපි මිනිස්සු විදිහට වඩා පොහොසත් මනුෂ්‍ය සම්බන්ධතා සහිත සමාජයක් නිර්මාණය කරන්න. විවිධත්වය කියන්නේ හරි ලස්සන දෙයක් මානව ලෝකයේ හමුවන මුල්ම වෙනස ස්ත්‍රිය හා පුරුෂයා අතර තිබෙන වෙනස යි. හැබැයි මේ වෙනස සමාජ සංස්කෘතික දේශපාලන වශයෙන් අර්ථකථනය වෙනකොට, යම් යම් ව්‍යුහයන් තුළ මතු වෙද්දී පුරුෂ කේන්ද්‍රීය බවක්, ආන්තිකකරණය වීමක් දැකගන්න පුළුවනී ඒ වගේ පසුබිමක් තුළ පොදු මනුෂ්‍යත්වය වෙනුවට අනෙකෙකු එහෙම නැත්නම් අපි ඉංග්‍රීසියෙන් (the other) කියලා කියනවා - එහෙම අනෙකකු බවට පත්වෙන ප්‍රවණතාවක් දැකගන්න පුළුවන්. අපි මේ සියලු උත්සාහයන් දරන්නේ ඒ අනෙකා වෙනුවට ආත්මීයව වටහා ගන්න පුළුවන් පොදු මනුෂ්‍යත්වයක් නිර්මාණය කරන්න. වශයෙන් සඳහන් කළාය.

ප්‍රජාතන්ත්‍රවාදී රටක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ සමාජ අන්තර්කරණය පිළිබඳ සංවේදී මාධ්‍ය වාර්තාකරණයේ අත්‍යවශ්‍යතාව පිළිබඳ දැනුවත් කිරීම, පාර්ලිමේන්තු වාර්තාකරුවන්ට සහ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්ට මහජන නියෝජිතයින් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ මෙම කාලීන මාතෘකාව පිළිබඳ සාකච්ඡා කිරීමට අවකාශයක් නිර්මාණය කිරීම මෙම වැඩමුළුව සංවිධානය කිරීමේ අරමුණයි.



මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව සහ මාධ්‍ය වාර්තාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවේ වැදගත්කම පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උපදේශක ඉන්දික දයාරත්න මහතා විසින් ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී.

කාන්තාවන්ට එරෙහි හිංසනයන් වාර්තා කිරීමේ දී පැවතිය යුතු ආචාර ධර්ම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් අදහස් දැක්වූ අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී මාධ්‍ය වාර්තාකරණයෙහි මාධ්‍යවේදී අත්දැකීම් 'සිලෝන් ටුඩේ' ප්‍රවෘත්ති කර්තෘ මෙත්මලී දිසානායක මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී භාෂා භාවිතය පිළිබඳ මොරටුව මහ නගර සභා හිටපු මන්ත්‍රීනී නීතිඥ ලිහිණි ප්‍රනාන්දු මහත්මිය සිය අදහස් පළ කළාය.ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එරාන් වික්‍රමරත්න මහතා ස්ත්‍රී පුරුෂ සමාජභාවී කථාංග, මාතෘකා සහ අන්තර්ගත හඳුනා ගැනීම පිළිබඳ සිය අදහස් දැක්වූ අතර වැඩමුළුවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදී නාරද බක්මීවැව මහතා විසින් මෙහෙයවනු ලැබීය.

මෙම වැඩමුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය විසින් සංවිධානය කරනු ලැබීය.

# පුවත්

# පාර්ලිමේන්තු සංවර්ධනය පිලිබඳ ජාත්‍යන්තර විශේෂඥ කෙවින් ඩෙවෝක්ස් මහතා කථානායකතුමා හමුවෙයි

කැනඩාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සහ පාර්ලිමේන්තු සංවර්ධනය පිලිබඳ ජාත්‍යන්තර විශේෂඥයෙක් වන කෙවින් ඩෙවෝක්ස් මහතා සහ සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මේ මස 14 වනදා පාර්ලිමේන්තු පරිශ්‍රයයේදී පැවැත්විණි මෙම හමුවට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මෙරට නේවාසික නියෝජිත අසුසා කුබෝටා මෙනවියද එක්ව සිටියාය.

මෙම අවස්ථාවට නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ, නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන්, පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහනධීර, සහකාර මහලේකම් හංස අබේරත්න සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන නියෝජනය කරමින් එහි ප්‍රතිපත්ති විශේෂඥ සහ පාලන ප්‍රධානී චන්ද්‍රිකා කරුණාරත්න,යන මහත්ම මහත්මීන් සහ කථානායකතුමාගේ විදේශ කටයුතු සම්බන්ධීකරණ ලේකම් වෛද්‍ය චමීර යාපා මහතා ද සහභාගී විය.











# පුවත්

## රත්නපුර කුඩා ජේසු බිළිඳාගේ කනයාරාම ජාතික පාසලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුව උත්කර්ෂවත් අයුරින් පැවැත්වේ

පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ප්‍රජාතන්ත්‍රවාදය, වගකීම සහ වගවීම මෙන්ම ඡන්දය භාවිත කිරීමේ වැදගත්කම සම්බන්ධව ප්‍රායෝගික අවකාශය මෙරට පාසල් ප්‍රජාව වෙත විවර කර දීමේ අරමුණින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය මඟින් සංවිධානය කළ මෙම වැඩටහන පසුගියදා රත්නපුර කුඩා ජේසු බිළිඳාගේ කනයාරාම ජාතික පාසැල් ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.



එහිදී පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව මංගල සභාවාරයේදී අභිනව කතානායකවරිය තෝරාපත් කර ගන්නා ලදී ඉන් අනතුරුව අමාත්‍යවරියන් හා මන්ත්‍රීවරියන් දිවුරුම් දීමෙන් පසු එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව කරුණු දක්වමින් පාර්ලිමේන්තු විවාදයක්ද පැවැත්වීය.



මෙහිදී පාර්ලිමේන්තුව හා එහි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායක සේවා හා සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච් ඊ ජනකාන්ත සිල්වා මහතා විශේෂ දේශනයක් සිදු කළ අතර, මහජනතාව වෙනුවෙන් මන්ත්‍රීවරයන්ගේ නියෝජනය පිළිබඳව පාර්ලිමේන්තුවේ පරිපාලන අධ්‍යක්ෂ ජී තච්චනරාණි මෙනවිය විසින් ද පුළුල් අවබෝධයක් ලබා දෙන ලදී.



මෙම අවස්ථාවට රත්නපුර අධ්‍යාපන කලාපයේ පාසල් හයක ශිෂ්‍ය නියෝජිතයන්, විෂය භාර ආචාර්යවරුන් සහ දෙමාපියන් ද සහභාගී වූ අතර, එම සෑම පාසලකම පුස්තකාල සඳහා පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථ ප්‍රදානයක්ද සිදු කෙරිණි.






# රුමේනියානු රාජ්‍ය ලේකම්වරයා කථානායකවරයා හමුවෙයි

නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින රුමේනියාවේ රාජ්‍ය ලේකම් සහ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ට්‍රයෙන් හිරිස්ටියා ( Traian Hristea) මහතා ඇතුළු දූත පිරිස මේ මස 26 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

මෙම දූත පිරිසට රුමේනියානු විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ඩයනා ටේස්,විදේශ කටයුතු අමාත්‍යාංශයේ කවුන්සිලර් බෝග්ඩන් අල්ටියා සහ ශ්‍රී ලංකාවේ රුමේනියානු තානාපති ආචාර්ය වික්ටර් චියුජ්ඩියා යන මහත්ම මහත්මීහු ද සහභාගි වූහ.



රුමේනියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව රාජ්‍ය ලේකම් ට්‍රයන් හ්‍රිස්ටියා සිය ප්‍රසාදය පළ කළ අතර දෙරට අතර ශක්තිමත් සබඳතාවක් ඇති කිරීමට මෙය ඉතා වැදගත් බවද සඳහන් කළේය. තවද මෙමඟින් කම්කරු අංශය, අධ්‍යාපන, වෙළෙඳ, ආයෝජන, සයිබර් ආරක්ෂාව,තොරතුරු තාක්ෂණය සහ සංචාරක යනාදී බොහෝ ක්ෂේත්‍රවල දෙරට අතර සහයෝගිතාව සඳහා මඟ සැලසෙනු ඇතැයි ඔහු විශ්වාසය පළ කළේය.



ශ්‍රී ලාංකිකයින්ට රුමේනියාවේ සේවය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව කෘතවේදීත්වය පළ කළ කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ශ්‍රී ලංකා - රුමේනියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ආරම්භ කර ඇති බවත් ඒ හරහා ඉදිරියේදී තවදුරටත් සබදතා තර කර ගැනීමට අපේක්ෂා කරන බවත් සඳහන් කළේය. එසේම, රුමේනියානු පාර්ලිමේන්තුවේ කථානායක තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසකට ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදෙන ලෙස ද කථානායකවරයා ආරාධනා කළේය.



මීට අමතරව, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා, විශ්වවිද්‍යාල අතර අවබෝධය, රැකියා සඳහා යන අයගේ වීසා ක්‍රියාවලියේදී මතුවන ගැටලු ඇතුළු කරුණු පිළිබදව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.



මෙම හමුවට ශ්‍රී ලංකා - රුමේනියානු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සාමාජිකයින් වන රාජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් සහ ගරු අශෝක ප්‍රියන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු යදාමිනි ගුණවර්ධන, ගරු මධුර විතානගේ, ගරු වේලු කුමාර්, ගරු ෂානක්කියන් රාසමාණික්කම් සහ පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.



# පාර්ලිමේන්තු මහලේකම් ධූරයට පත් වූ කුෂානි රෝහණදීර මහත්මියට ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිනිය ජූලි චංග් මහත්මිය සුබ පතයි

ශ්‍රී ලංකාවේ ඇමෙරිකා එක්සත් ජනපද තානාපතිනිය වන ජූලි චංග් මහත්මිය, පාර්ලිමේන්තුවේ නව මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය හමුවී සුබ පැතුම් එක් කළාය.

තානාපතිවරිය මේ මස 02 වැනිදා පාර්ලිමේන්තුවේ දී මහලේකම්තුමිය හමුවෙමින් පවසා සිටියේ ආයතනයක් ලෙස පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ශක්තිමත් කිරීම සඳහා නිරතුරුව සහය ලබා දෙන බවයි.




පැවති සුහද සාකච්ඡාවේදී කුෂානි රෝහණධීර මහත්මිය සඳහන් කළේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය පුළුල් වී ඇති අතර නව කාරක සභා රැසක් ක්‍රියාත්මක වන බවයි රාජ්‍ය පාලන ක්‍රියාවලියට තරුණයින් සම්බන්ධ කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින බවත්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සවිබල ගැන්වීම පිළිබඳ පනත් කෙටුම්පත් මෙන්ම අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා කටයුතු කරන බවත් මහලේකම්වරිය වැඩිදුරටත් පැවසුවාය.

රෝහණදීර මහත්මියගේ පත්වීම කාන්තා ප්‍රජාවට මෙන්ම සියලු දෙනාටම සතුටට කරුණක් බවත් අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් පැවති සුහද සාකච්ඡාවේදී තානාපතිවරිය සඳහන් කළාය.



# රේගු ක්‍රියාවලියේ පවතින ගැටලු සහ දුර්වලතා හදුනාගැනීමට ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව ශ්‍රී ලංකා රේගු මූලස්ථානය ඇතුළු පරිශ්‍රයන්හි නිරීක්ෂණ චාරිකාවක

පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව මේ මස 23 වැනිදා කොළඹ පිහිටි ශ්‍රී ලංකා රේගු මූලස්ථානය ඇතුළු පරිශ්‍රයන්හි නිරීක්ෂණ චාරිකාව නිරත විය.

රජයේ ආදායම වැඩිකිරීම ඇතුළු සාධනීය පියවරයන් නිර්දේශ කිරීම සඳහා වන ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අදාළ ආයතන පරිශ්‍රයන් වෙත ගොස් විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම විමර්ශනය සිදුවිය.

ක්‍රම සහ විධි කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක, සාමාජික මන්ත්‍රීවරු වන රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න, ගරු අශෝක් අබේසිංහ, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා සහ ගරු ගාමිණී වලේබොඩ යන මහත්වරු මෙම අවස්ථාවට එක්වූහ.

රජයට ආදායම් ලබා දෙන ප්‍රධානතම ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රේගු ක්‍රියාවලියේ පවතින දුර්වලතා හදුනාගනිමින් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට සහ ආදායම ඉහළ නැංවීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම සංචාරය සංවිධානය වී තිබිණි.



මේ අනුව රේගු මූලස්ථානයේ තොරතුරු තාක්ෂණ අංශය, වරාය භූමිය තුළ පිහිටි බහාලුම් සුපරීක්ෂා කිරීම් (Scan) අංශය සහ ඔරුගොඩවත්ත පිහිටි ශ්‍රී ලංකා රේගුවට අයත් බහාලුම් පරීක්ෂා කිරීමේ අංගනය ඇතුළු අංශවල කටයුතු මෙහිදී නිරීක්ෂණයට ලක්විය.

ආනයන සහ අපනයන ක්‍රියාවලියේ පවතින ප්‍රමාදයන් මගහරවාගනිමින් කාර්යක්ෂම සේවයක් ලබා දීමටත්, ආදායම වැඩිකරගැනීමටත්, වත්මන් කෘතිම බුද්ධිය (AI) ඇතුළු නවීණ පරිගනක තාක්ෂණය භාවිත කිරීමේ අවශ්‍යතාව.



මෙහිදී කාරක සභා සභාපති ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් පෙන්වා දෙන ලදී එසේම රේගු ක්‍රියාවලියේ දැනට පවතින දුර්වලතා නිවැරදිකර ගැනීමට ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPIs) යොදා ගැනීමේ අවශ්‍යතාව ඇතුළු සාධනීය පියවරයන් පිළිබදව කාරක සභා සභාපතිවරයා කරුණු පැහැදිළි කළේය.

ආනයනකරුවන්ට කඩිනම් සේවාවක් ලබාදීම සදහා වාප්පු ලිපිකරු ( Wharf Clerk) සේවය වඩාත් කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන් කාරක සභා සභාපතිවරයා වරාය, ගුවන්තොටුපළ මෙන්ම ශ්‍රී ලංකා රේගුව ද දවසපුරා අඛන්ඩ සේවාවක් සැපයීමේ අවශ්‍යතාවය පෙන්වා දුන්නේය.

මේ අනුව අදාළ නිර්දේශ ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ද ඒ මහතා පැවසීය.

මෙම නිරීක්ෂණ චාරිකාවට පෙර ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීහු මෙන්ම ආනයන අපනයන ක්‍රියාවලියේ නිරත ආයතන යන දෙපාර්ශවයම වෙන් වෙන් වශයෙන් පාර්ලිමේන්තුවේදී මෙම කාරක සභාවට කැඳවා පවතින ගැටලු සහ අඩුලුහුඬුකම් පිළිබදව පුළුල් ලෙස සාකච්ඡා කිරීම සිදුවිය.

වැඩබලන රේගු අධ්‍යක්ෂ ජනරාල් කේ.විමලේන්ද්‍රරාජා මහතා ඇතුළු ශ්‍රී ලංකා රේගුවේ ඉහළ පෙළේ නිලධාරීහු රැසක් ද මෙම අවස්ථාවට එක්ව සිටියහි එසේම පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබද කාරක සභාවේ ලේකම් බුද්ධිකා අබේසිංහ මහත්මිය ඇතුළු නිලධාරීහු පිරිසක් ද මීට සහභාගී වූහ.

# කාරක සභා පුවත්



# 2019 වර්ෂයේදී රුපියල් බිලියන 34ක් වැයකොට අධ්‍යාපන අමාත්‍යාංශය මිලදීගත් ටැබ් පරිගණක හා ආරෝපිත රාක්ක පළදායී ආකාරයෙන් යොදවා නොමැති බව කෝපා කමිටුවේදී අනාවරණය වේ.

- අධ්‍යාපන කළමනාකරණ දත්ත පද්ධතිය (NEMIS) වෙනුවෙන් 2013 හා 2014 වර්ෂ වලදී රු මිලියන 64 වියදම් කළද ප්‍රමාණවත් දත්ත එහි අන්තර්ගත නැති බව හඳුනාගනී
- උසස් පෙළ සිසුන්ගේ පාසැල් පැමිණීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතීම පිළිබඳ අවධානය
- හඳුනාගත් රාජකාරියක් නොමැතිව ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ කාර්යාලයට කාර්යාල සහායකයෙකු පත්කොට වසර 13ක් වෙනුවෙන් රු 60,639,544 ගෙවීම පිළිබඳ අවධානය
- පිරිවෙන් අධ්‍යාපනයේ ගැටලු පිළිබඳ අවධානය



2019 වර්ෂයේදී රුපියල් බිලියන 34ක් වැයකොට උසස්පෙළ සිසුන් හා ගුරුවරුන් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මිලදීගත් ටැබ් පරිගණක හා ආරෝපිත රාක්ක පලදායී ආකාරයෙන් යොදවා නොමැති බව කෝපා කමිටුවේදී අනාවරණය විය.

මේ පිළිබඳ අනාවරණය වුයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019/2020/2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාකිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 20 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහිදී අනාවර්ණය වුයේ ඇතැම් ටැබ් පරිගණක වගකීම් කාලය අවසන් වන තුරුද බෙදා දී නොමැති බවයි එසේම වර්තමානය වන විට බෙදාහරින ලද ටැබ් පරිගණක වලින් වැඩි ප්‍රමාණයක් නිෂ්කාර්යව පවතින බවත් එසේම යම් ප්‍රමාණයක් අස්ථාන ගතව පවතින බවත් මෙහිදී අනාවරණය විය් තවද මෙම ටැබ් පරිගණක සාදාරණ ආකාරයෙන් බෙදාහැර නොමැති බවද මෙහිදී හෙළි විය.

මේ අනුව සැප්තැම්බර් 26 වැනිදාට පෙර මේ පිළිබඳ පූර්ණ විස්තර සහිත වාර්තාවක් කෝපා කමිටුවට ලබාදීමට නිර්දේශ කළේය.

අධ්‍යාපන කළමනාකරණ දත්ත පද්ධතිය (NEMIS) වෙනුවෙන් 2013 හා 2014 වර්ෂ වලදී රු මිලියන 64 වියදම් කළද ප්‍රමාණවත් දත්ත එහි අන්තර්ගත නැති බවද මෙහිදී අනාවරණය විය් මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ මෙහි ගුරුවරුන් පිළිබඳ දත්ත අන්තර්ගත වන බවත් ළමුන් පිළිබඳ දත්ත අන්තර්ගත වන්නේ වෙනත් පද්ධතියක බවත්ය.

එසේම මෙම පද්ධතිය යාවත්කාලීන වීමේ දුර්වලතාවක් පවතින බවද පැවසීය.

මෙහිදී කෝපා කමිටුව පෙන්වා දුන්නේ මෙහි පවතින දත්ත ප්‍රමාණවත් නොමැති බවයි මේ නිසා මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සොයා බැලීමට ජූලි 07 වැනි දින මේ සම්බන්ධ සියලු පාර්ශ්වයන් කෝපා කමිටුවට කැඳවන බවයි.

එසේම උසස් පෙළ සිසුන්ගේ පාසැල් පැමිණීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය් මේ අනුව මේ පිළිබඳ 2020 වර්ෂයේදී පර්යේෂණයක් සිදු කොට නිර්දේශ 15 ක් ලබාදී ඇති බව නිලධාරීන් පෙන්වා දුන්නේයි මෙහිදී කමිටුව පැවසුවේ අද වන විට පවතින තත්ත්වය මීට වඩා වෙනස් වන බැවින් මෙම නිර්දේශ තවදුරටත් යාවත්කාලීන විය යුතු බවයි.

හඳුනාගත් රාජකාරියක් නොමැතිව ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ කාර්යාලයට කාර්යාල සහායකයෙකු පත්කොට 2007 වසරේ සිට 2021 දක්වා වසර 13ක් වෙනුවෙන් රු 60,639,544 ගෙවීම පිළිබඳ මෙහිදී සාකච්ඡා වූ අතර මෙම ගෙවීම් සිදු කොට ඇත්තේ කැබිනට් අනුමතියකින් බව පැමිණ සිටි නිලධාරීහු පෙන්වා දුන්හ. මේ අනුව මෙම තනතුර 2021 දෙසැම්බර් 31 දින සිට බලාත්මක වන පරිදි 2022 ජනවාරි 25 දින අහෝසි කොට ඇති බවත් මෙහිදී සඳහන් විය. කෙසේවෙතත් මෙම නිලධාරිනිය මෙම තනතුරු අහෝසි කිරීමට විරුද්ධව එරට නීතිය යටතේ නඩුවක් ගොනු කර තිබූ බවත් වන්දි ලෙස යුරෝ 3089856 ක් ඉල්ලා ඇති බවත් මෙහිදී සඳහන් විය.

මේ අනුව මේ පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත කෝපා කමිටුවට ලබාදීමට නිර්දේශ කළේය.

# බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගැටලු රැසක් කෝපා කමිටුවේදී අනාවරණය වෙයි

▪ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නව පනතක් සකස් කරන ලෙසට නියෝග
▪බන්ධනාගාර තුළ තදබදය 250% කින් ඉහළ නැගලා
▪සේවක පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට උපදෙස්
▪රසපරීක්ෂක වාර්තා කඩිනම් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගැටලු රැසක් රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 09 වැනිදා පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිහිටුවීමේ පවතින පනත වෙනුවට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නව පනතක් සකස් කරන ලෙස ලෙස මීට පෙර කෝපා කමිටුවෙන් නිර්දේශ කර තිබියදීත් එම කටයුතු ප්‍රමාදවීම වීම කෙරෙහි කමිටුවේ අප්‍රසාදය පළ විය. ඒ අනුව මෙම කටයුතු අවසන් කිරීම පිළිබඳව නිශ්චිත කාල රාමුව සහිත වාර්තාවක් ජූලි 10 වන විට ලබා දෙන ලෙස කමිටු සභාපතිවරයා නියෝග කළේය.

බන්ධනාගාර තුළ ධාරිතාව ඉහළ ගොස් ඇති බවත් මෙම අගය සාමාන්‍යයෙන් 259%ක අගයක් ගන්නා බවත් ඇතැම් බන්ධනාගාරවල මෙම අගය 300% -400% ක වැඩිවීමක් ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා පැවසීයි මේ අනුව බන්ධනාගාර තුළ රැඳවුවන් 11762 ක සංඛ්‍යාවක් සඳහා පමණක් ඉඩකඩ පැවතියද මේවන විට 26791 ක ප්‍රමාණයක් බන්ධනාගාරගතව සිටින බව ද මෙහිදී අධිකරණ අමාත්‍යාංශ ලේකම් වසන්තා පෙරේරා මහත්මිය අනාවරණය කළාය.

මෙම සංඛ්‍යාවෙන් 17502 ක් රිමාන්ඩ් සිරකරුවන් බවද ඉන් 10470ක්ම මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් බවද මෙහිදී හෙළිවිය එසේම වැරදිකරුවන් බවට අධිකරණයෙන් නියමවූ පුද්ගලයන් 9289 ක් සිටින බවත් ඉන් 3569ක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් බවත් බන්ධනගාර කොමසාරිස් ජනරාල්වරයා පැවසීය. මේ අතරින් 1309 ක් දඩමුදල් ගෙවාගත නොහැකිව බන්ධනාගාරතව සිටින පිරිස බවද මෙහිදී අනාවරණය විය.දඩමුදල් ගෙවාගත නොහැකි පිරිසට වෙසක් පොසොන් වැනි අවස්ථාවලදී විශේෂ සමාව යටතේ නිදහස් කළද නැවත කෙටිකලක් තුළ වැරදිකරුවන් ලෙස බන්ධනාගාරගතවීම විශාල ගැටලුවක් බවද අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චන්දන ඒකනායක මහතා මෙහිදී පැවසීය.

මේ වන විට මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩිවී ඇති බවද මෙහිදී අනාවරණය විය. මේ අනුව නව මධ්‍යස්ථාන 9 ක පුනරුත්ථාපන කටයුතු සිදුවන බවද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා පැවසීය. මෙම තත්ත්වය පාලනය සඳහා අවශ්‍ය යෝජනා සහ සැලසුම් කඩිනමින් සකස් කොට ඉදිරිපත් කරන ලෙසද නිලධාරීන්ට කමිටුව දන්වා සිටියේය.



එසේම මේ වන විට සිටිය යුතු සමස්ත සේවක සංඛ්‍යාව වන 7872න් පුරප්පාඩු 1663ක් පවතින බවද අනාවරණය විය.මේවා සම්පූර්ණ කිරීමට මෙන්ම සමස්ත සේවක සංඛ්‍යාවේ වැඩිවීමක් අවශ්‍යනම් ඊට අදාළ සැලසුම් සහ යෝජනා ඉදිරිපත් කරන ලෙසද කෝපා සභාපතිවරයා උපදෙස් දෙන ලදී.

බන්ධනාගාරය තුළ පුද්ගල ශරීර පරීක්ෂාව සිදුකරන සහ භාණ්ඩ මලු පරීක්ෂාව සඳහා පවතින යන්ත්‍ර 11කින් 4ක් ක්‍රියා විරහිත බවද අනාවරණය විය.මෙම යන්ත්‍ර වසර 10කට වැඩි කාලයක් පැරණි බැවින් අලුත්වැඩියාවට යන වියදමට සාපේක්ෂව නව යන්ත්‍ර මිලදී ගැනීම ලාබදායී බව නිලධාරීහු පෙන්වා දුන්හ.මේ අනුව සියලු බන්ධනාගාරවලට අදාළව අවශ්‍ය යන්ත්‍ර පිළිබඳව සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස කෝප් සභාපතිවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.



බන්ධනාගාරය තුළ දුරකථන සංඥා ක්‍රියා විරහිත කරන 'ජෑමර්' උපකරණ නිසා අවට ප්‍රදේශවල ද සංඥා ක්‍රියාත්මක නොවීම පිළිබදව මෙහිදී අවධානය යොමු විය.දැනට යුධ හමුදාවේ සංඥා බලකාය මගින් මෙම කටයුතු සිදුකරන බවත් අදාළ ප්‍රදේශයට පමණක් ඉතා නිවැරදීව ක්‍රියාත්මක වන තාක්ෂණයක් මේවන විට දියුණු රටවල පවතින බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා පැවසීය. ඒ අනුව අදාළ ආරක්ෂක අංශ සමග මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග මේ පිළිබද සාකච්ඡා කොට අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා ලෙස කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

රසපරීක්ෂක වාර්තා පමාවීම පිළිබදව ද කමිටුවේ සාකච්ඡා වියි මෙහිදී රජයේ රසපරීක්ෂක දීපිකා සෙනෙවිරත්න මහත්මිය පවසා සිටියේ විද්‍යාත්මක නිලධාරීන් බහුතරයක් විදේශගතවීම නිසා පුරප්පාඩු 25ක් පවතින බවයි. කෙසේ වෙතත් ලබා දීමට නියමිත වාර්තා ප්‍රමාණය 3944 ක් දක්වා අඩු කරගැනීමට හැකිවූ බවත් තවත් නිලධාරීන් 15ක් කොන්ත්‍රාත් පදනම යටතේ බදවාගෙන කඩිනමින් ගොඩගැසී ඇති ප්‍රමාණය අවසන් කරන බවත් ඇය පවසා සිටියාය. එසේම 2021, 2022 වසරවල සාමාන්‍යයෙන් මසකට ලබා දිය යුතු වාර්තා ප්‍රමාණය 1200-1500 අතර වුවද මේ වසරේ මසකට 2500 කට වැඩි ප්‍රමාණයක් ලැබෙන බවත් පවසා සිටියාය. ඉන් විශාල ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සිද්ධීන් බවත් මෙහිදී හෙළිවිය.අවශ්‍ය සේවක සංඛ්‍යාව සම්පූර්ණ කොට මෙම කටයුතු විශේෂ කාර්යක් සේ සලකා කඩිනමින් ඉටුකරන ලෙස කමිටුව උපදෙස් දුන්නේය.

මීට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුව සම්බන්ධ නිවැරදි පරිගණක දත්ත පද්ධතියක් සැකසීමේ අවශ්‍යතාව, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී සිරකරුවන්ගේ ආහාර සැපයීම සදහා අතාත්වික මිලගණන් යොදා ටෙන්ඩරය ලබා ගැනීමෙන් අනතුරුව ආහාර ප්‍රමිතිය අඩුකිරීම යනාදි කරුණු පිළිබදවද සාකච්ඡා විය.












# කොළඹ මහා නගර සභාවේ 2022 වර්ෂයේ හිඟ ආදායම රුපියල් මිලියන 6,280 ක් - කෝපා කමිටුවේදී අනාවරණය වෙයි.

- රථගාල් ගාස්තු අයකිරීමට කොන්ත්‍රාත් ලබාගත් පෞද්ගලික ආයතන 38 කින් 2021 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු හිඟ ගාස්තුව රු මිලියන 26550 ක්
- කොළඹ නගරයේ ගිනි නිවන ඒකකය සහ ගුවන් හමුදාව සමග ඇති සම්බන්ධීකරණය වැඩි කිරීමට අවධානය
- විධිමත් පරිදි දැන්වීම් ආදායම ලබානොගැනීම පිළිබඳ අවධානය



කොළඹ මහා නගර සභාවේ 2022 වර්ෂයේ හිඟ ආදායම රුපියල් මිලියන 6,28050 ක් බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී (කෝපා) අනාවරණය විය.

මේ පිළිබඳ අනාවරණය වුයේ කොළඹ මහා නගර සභාවේ 2020/2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාකිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහිදී 2021 වර්ෂයේ මුලු හිඟ ආදායම රු මිලියන 5,8356 ක් බවද, 2020 වර්ෂයේ රු මිලියන 5,3864 ක් බවද, 2019 වර්ෂයේ 4,4815 බවද අනාවරණය විය.මෙහිදී වරිපනම් බදු, කුලී සහ වෙනත් බදු වශයෙන් මෙම හිඟ මුදල් පවතින බව හදුනාගැණුනි.

මේ අනුව පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ හිඟ බදු පවතින දේපල අත්පත් කරගැනීමට කටයුතු කරමින් සිටින බවයි. එසේම ඇතැම් දේපල වල හිමිකරුවන් හඳුනාගැනීම සම්බන්ධයෙන් ගැටලු පවතිනබවත්, මහා නගර සභාවේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිටින නිලධාරීන් හිඟවීමත් මෙම හිඟ මුදල් අයකරගැනීමේදී ගැටලු ලෙස මතුවී ඇති බවයි.

පැමිණ සිටි කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් පෙන්වා දුන්නේ අනවසර ඉදිකිරීම් සඳහාද වරිපනම් අංක ලබාදී ඇති බවයි. මේ අනුව කමිටුව නිර්දේශ කළේ 2023 ජූලි මස 06 දින වන විට මෙම මුදල් අයකර ගැනීමට දින වකවානු සහිතව වැඩපිළිවෙළක් සකස් කොට සම්පූර්ණ වාර්තාවක් කෝපා කමිටුවට ලබාදෙන ලෙසයි.



එසේම රථගාල් ගාස්තු අය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පෞද්ගලික ආයතන විසින් නගර සභාවට ගෙවිය යුතු මාසික කුලී මුදල් ගෙවීම දිගින් දිගටම පැහැර හැර ඇති බවත් 2021 දෙසැම්බර් 31 දින වන විට ආයතන 38 කින් අයකරගත යුතු හිඟ ගාස්තු ආදායම රු මිලියන 265 ක් බවත් අනාවරණය විය.



තවද මෙහිදී කොළඹ මහනගරසභාවේ ගිණි නිවන ඒකකය පිළිබඳවද සාකච්ජා වූ අතර මෙම අංශයේ සේවය අගය කරන බවද ලංකාව පුරා මෙය ව්‍යාප්ත විය යුතු බවද කෝපා කමිටුවේ සභාපතිවරයා පැවසීය.එසේම මෙහිදී සඳහන් වූයේ උස මහල් 20ක් පමණ වන තෙක් ගොඩනැගිලි වල ගිණි නිවීමට මෙම අංශයට පහසුකම් පවතින බවයි. මෙහිදී කෝපා කමිටු සභාපති ලසන්ත අලගියවන්න මහතා පැවසුවේ මහල් 20 ඉක්මවන ගොඩනැගිලි වල ගින්නක් ඇති වුවහොත් ගුවන් හමුදාවේ සහයෝගය ලබාගැනීම වැදගත් වන බවයි.මේ නිසා ගුවන් හමුදාව සමග සම්බන්ධීකරණය වැඩිකර ගැනීමට කෝපා කමිටු සභාපතිවරයා උපදෙස් දුන්නේය. තවද ගිණි නිවන ඒකකයේ පවතින පුරප්පාඩු පිළිබඳවත් මෙහිදී සාකච්ජා විය.



එසේම  විධිමත් පරිදි දැන්වීම් ආදායම ලබානොගැනීම පිළිබඳවද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ජා කිරීම සිදු විය.මේ අනුව මේ සඳහා විධිමත් ක්‍රියාවලියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සහ එය නිවැරදිව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව කාරක සභාවේ සභාපතිවරයා පෙන්වා දෙන ලදී.



කොළඹ 07 ප්‍රදේශයේ පවතින ඉඩමක වරිපනම් ගෙවීම මගහැරීම පිළිබඳව සහ ඉඩම් ලේඛන නිවැරදිව පවත්වාගෙන නොයෑම පිළිබඳ මෙහිදී අවධානය යොමු විය.මේ අනුව මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ජූලි මස 06 වැනිදා වන විට කෝපා කමිටුවට ලබාදෙන ලෙස කමිටු සභාපතිවරයා නිර්දේශ කළේය.එසේම බස්නාහිර මහා නගරසභා කොමසාරිස් කාර්යාලයේ දුර්වල අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳවද මෙහිදී සාකච්ජා කෙරුණි.

තවද කොළඹ නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ජා වූ අතර ජුනි 21 දින මේ පිළිබඳ සාකච්ජා කිරීමට කෝපා කමිටුව රැස් වන බවයි එදින මෙම ව්‍යාපෘතිය සම්බන්ධ සියලු පාර්ශ්වයන් කෝපා කමිටුවට කැදවන බවද කෝපා කමිටුවේ සභාපතිවරයා පැවසීය.

මීට අමතරව ඝණ අපද්‍රව්‍ය බැහැරකිරීමේ ක්‍රමවේදය පිළිබඳවද මෙහිදී සාකච්ජා විය.





# මාධ්‍ය හමුව නිසා විගණකාධිපතිවරයා සහ කෝප් කමිටුව සම්බන්ධයෙන් වැරදි අදහසක් සමාජගතවූයේ නම් සමාව ඉල්ලා සිටින බව භූ විද්‍යා සහ පතල් කැනීම් කාර්යංශය කෝප් කමිටුව හමුවේ පවසයි

▪කැබිනට් සංදේශයක් මගින් පනත සංශෝධනය සදහා බලය ලබා ගැනීමට සති දෙකක් තුළ කටයුතු කරන ලෙසටත් නිර්දේශ

▪බලපත්‍ර ලබාගැනීමේ සංකීර්ණ ක්‍රමවේදය වෙනුවට මානව හිතවාදී නව ක්‍රමවේදයක් සකස් කිරීමටත් නියෝග

▪කැනීම් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන් හෝ ආයතන සහ අදාළ කාලසීමාවන් පිළිබඳ පූර්ණ වාර්තාවක් සති දෙකක් තුළ ලබා දීමටත් උපදෙස්

ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 13 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය කැදවා තිබිණි මේ අනුව මෙම අවස්ථාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ සභාපති ආරීසංජීපන් සහ අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) එම්එම්ජේපීඅජිත් ප්‍රේමා යන මහත්වරු සහභාගී වූහ.

භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය මගින් මාධ්‍ය හමුවක් පවත්වා කෝප් කමිටුව සම්බන්ධව කරුණු දැක්වීම පිළිබදව මෙහිදී කරුණු විමසන ලදී. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ සභාපතිවරයා මෙහිදී පවසා සිටියේ කෝප් කමිටුව විවේචනය කිරීමේ අරමුණක් නොතිබූ බවත් යම් ආකාරයක අපහසුතාවක් සිදුවූයේ නම් ඒ පිළිබදව සමාව ඉල්ලා සිටින බවත්ය.

විගණකාධිපතිවරයාගේ නිර්දේශ කිසිදු පුද්ගලයෙකු හෝ ආයතනයක් ඉලක්ක කරගනිමින් ලබා නොදෙන බවත්, කමිටුවට ඇති බලතල අනුව ක්‍රියාකරන බවත් කෝප් සභාපතිවරයා විසින් මෙහිදී පෙන්වා දෙන ලදී.විගණකාධිපතිවරයා හෝ කෝප් කමිටුව විවේචනය කිරීම මගින් මෙම ගැටලුවලට විසදුම් නොලැබෙන බවත්,මෙය වැරදි පූර්වාදර්ශයක් විය හැකි බැවින් මින් ඉදිරියට එවැනි ක්‍රියා සිදු නොවීමට වගබලා ගැනීමේ අවශ්‍යතාවත් අවධාරණය කෙරිණි.

බලපත්‍ර නිකුත් කිරීම,බලපත්‍ර නිකුත් කොට අහෝසි කිරීම,විගණකාධිපතිවරයාගේ විගණන විමසුම්වලින් නිරීක්ෂණය කරන ලද කරුණු පිළිබද අදහස් දැක්වීමට මෙහිදී කාර්යංශයට අවස්ථාව ලබා දෙන ලදී බලපත්‍ර ලබාදීමේදී අදාළ අනෙකුත් ආයතනවල අනුමතිය ලබාගැනීමේදී ප්‍රමාදයන් සිදුවන බව කාර්යංශයේ සභාපතිවරයා පවසා සිටියේය. දිස්ත්‍රික් කාර්යාල මගින් බලපත්‍ර ලබා දීමේ කටයුතු සියල්ල සිදුකර අධ්‍යක්ෂ ජනරාල්වරයා සදහා අවසන් අනුමතිය සදහා යොමුකරන බවත් අමාත්‍යවරයා වෙත යැවීම සිදුකරන්නේ දැන ගැනීම සදහා පමණක් බවත් ඔහු පැවසීය.

බලපත්‍ර අහෝසි කිරීමේදී නැවත අභියාචනා ඉදිරිපත් කළ පසු එම කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරියෙක් නොමැතිවීම නිසා ඇණහිට තිබීම පිළිබදව අවධානය යොමුවිය.කොන්ත්‍රාත් පදනම මත නීති නිලධාරියෙක් අමාත්‍යාංශයට බදවා ගැනීමට කටයුතු කරන ලෙස කමිටුව අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දුන්නේය.

කැනීම් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන් හෝ ආයතන සහ අදාළ කාලසීමාවන් පිළිබදවත් ඒවා අක්‍රීය පවතිනනම් ඒ සියලු කරුණු කාරණා ඇතුළත් වාර්තාවක් සති දෙකක් තුළ ලබා දීමටත් මෙහිදී නියෝග කෙරිණි.

මෙම ගැටලු විසදා ගැනීම සදහා නව පනතක් හදුන්වාදීමේ අවශ්‍යතාව මෙහිදී සාකච්ඡා වියි ඒ අනුව කැබිනට් සංදේශයක් මගින් පනත සංශෝධනය සදහා බලය ලබා ගැනීමට සති දෙකක් තුළ කටයුතු කර දන්වන ලෙස නිර්දේශ කෙරිණි.

එසේම බලපත්‍ර ලබාගැනීමේ සංකීර්ණ ක්‍රමවේදය වෙනුවට මානව හිතවාදී නව ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් කමිටු සභාපතිවරයා නියෝග කරන ලදී.

ඇතැම් ආයතනවලට ලබාදී ඇති අපනයන ඛනිජ සදහා වන කැනීම් බලපත්‍ර,කාර්යංශය හා ලේකම්වරයාට දැනුම්දීමකින් තොරව පැවරීම සිදුකරන අවස්ථා ඇති බව මෙහිදී අනාවරණය විය.ඩොලර් මිලියන 89 කට තවත් පාර්ශවයකට එවැනි බලපත්‍රයක් විකුණා ඇති අවස්ථාවක් වාර්තාවී ඇති බවද කාර්යංශ සභාපතිවරයා පැවසීය.එම තොරතුරු කඩිනමින් විගණකාධිපතිවරයාට ලබා දෙන ලෙසද කමිටුව දැනුම් දුන්නේය.

කාර්යාංශය සමග නිරන්තර අවධානයෙන් සිටිමින් එම කටයුතු අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව ලේකම්වරයාට කමිටුව විසින් අවධාරණය කරන ලදී.එසේම භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය සම්බන්ධව විමර්ශන කටයුතු සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සදහා පසුගිය කෝප් රැස්වීමේදී පත්කරන ලද කෝප් අනුකමිටුව මගින් ඉදිරි කටයුතු සිදු කරන බවත් කෝප් සභාපතිවරයා පැවසීය.

# සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පරිපාලන දුර්වලතා රැසක් කෝප් කමිටුවේදී අනාවරණය වෙයි

- අමාත්‍යාංශ ලේකම්වරයාම ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීම පිළිබඳ අවධානය
- ආයතනික සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට උපදෙස්
- මානව සම්පත් සැලැස්ම සති දෙකක් තුළ ඉදිරිපත් කිරීමට නියෝග
- ආයතනයේ සේවය නොකළ උපදේශකවරුන්ට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සතියක් තුළ වාර්තාවක් කැඳවයි
- මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අදාළ කරගැනීම පිළිබඳ නීතිපති උපදෙස් - ආයතනික වෙනස්කම් පිළිබඳ මහාභාරකරුගෙන් නිර්දේශ කැඳවයි
- පුවත්පත් ලිපියකට අදාළ නඩුවකදී රු මිලියන 500ක් ගෙවීමට නියම කිරීමේ සිද්ධිය පිළිබඳ වාර්තාවක්
- මිලියන 14ක මූල්‍ය වංචාවක් සිදුකළ හිටපු අලෙවි ප්‍රධානියාට රු මිලියන 25 ක් පාරිතෝෂික ගෙවීම පිළිබඳ පුළුල් විමර්ශනයක්

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 08 දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2020 හා 2021 වසරවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ විමර්ශනය කිරීම සිදුවිය.

මෙහිදී පහත සදහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය.

### අමාත්‍යාංශ ලේකම්වරයාම ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීම පිළිබඳ අවධානය

මෙහිදී ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති වරයා ලෙස කටයුතු කිරීම පිළිබඳව විගණකාධිපතිවරයා විමසීමක් කළේය. ආයතන සභාපතිවරයා අදාල අමාත්‍යංශයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ලෙස කටයුතු කිරීමේදී අමාත්‍යංශයේ ලේකම්වරයාට දෙනු ලබන නියෝග ක්‍රියාවට නැංවීම හමුවේ ගැටලුකාරී තත්ත්වයක් පැන නැගිය හැකි බව පෙන්වා දෙන ලදී.

එහිදී පත්වීම් දෙකම ජනාධිපතිවරයා විසින් කරන ලද ඒවා බව අමාත්‍යංශ ලේකම්වරයා සඳහන් කරන ලදී. ඒ අනුව ඒ සම්බන්ධව තවදුරටත් කරුණු විමසීමක් සිදු නොකළ අතර එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රධාන කොටස්කරුවා වන මහා භාරකාරකරු වෙත,මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

### ආයතනික සංයුක්ත සැලැස්මක පිළියෙල කිරීම

ආයතනය සතුව 2021-2024 වර්ෂ සදහා උපායමාර්ගක සැලැස්මක් පිළියෙල කර තිබුණද සංයුක්ත සැලැස්මක් නොතිබීම සම්බන්ධයෙන් අවධානය යොමු විය.2018 - 2020 කාලයේ උපක්‍රමික සැලැස්මක් වෙනුවෙන් රු මිලියන 10ක් වියදම්ව තිබීම පිළිබඳව අවධානය යොමුවිය.මේ අනුව ආයතනයේ වරලත් ගණකාධිකාරිවරුන් ඇතුළු ප්‍රවීණයන් රැසක් සිටින බැවින් ඔවුන්ගේ දායකත්වයෙන් සංයුක්ත සැලැස්මක් සකස් කරන ලෙසටත් උපදෙස් ලබා දීම සිදුවිය.

### මානව සම්පත් සැලැස්ම සති දෙකක් තුළ කෝප් කමිටුවට ලබාදෙන්න

ආයතනයේ හිටපු 1200 කට ආසන්න සේවක සංඛ්‍යාව මේවන විට 972 දක්වා අඩුකොට ඇති බවත් මෙම ප්‍රමාණය 850 දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන බවත් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති අනුෂ පැල්පිට මහතා පැවසීය.

2017 වසරේදී උපදේශකවරියකට රුමිලියන 31කට ආසන්න ගෙවීමක් සිදුකොට මෙන්ම 2022 වසරෙන් පසු කොන්ත්‍රාත් පදනම යටතේද මානව සම්පත් කලමණාකරණ සැලැස්මක් සකස්කර ඇති බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය. මේ අනුව සේවක සංඛ්‍යාව 850 කට සීමා කොට මෙලෙස සකසන ලද මානව සම්පත් සැලැස්ම සති දෙකක් තුළ කමිටුව වෙත ලැබීමට සලස්වන ලෙස කෝප් සභාපතිවරයා ජනමාධ්‍ය අමාත්‍යංශ ලේකම්වරයාට නිර්දේශ කළේය.



## ආයතනයේ සේවය නොකළ උපදේශකවරුන්ට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සතියක් තුළ වාර්තාවක් කැඳවයි

2020 දෙසැම්බර් 07 වන දින උපදේශකවරයෙකු ලෙස සමාගමට බඳවාගෙන රු මිලියන 18 ක මුදලක් ගෙවා තිබීම සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබූ තවත් උපදේශකයෙකු සදහාද සමාගමට කිසිදු සේවය-ක් නොගෙන උපදේශක ගාස්තු වශයෙන් රු ලක්ෂ 9ක මුදලක් ගෙවා තිබීම පිළිබද විගණකාධිපතිවරයා කරුණු පෙන්වා දුන්නේය.හිටපු අමාත්‍යවරයෙකුගේ නිර්දේශය මත මෙය සිදු කළ බව මෙහිදී අනාවරණය වූ අතර මේ සදහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු බව කමිටුව පෙන්-වා දෙන ලදී.

එසේම මෙවැනි අතපෙවීම්වලින් තොරව ස්වාධීනව කටයුතු කරගෙනයාමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්ම සකස් කරන ලෙස ද කමිටුව විසින් උපදෙස් දෙන ලදී ඉදිරියේදී කිසිදු අයුරින් මෙවැනි ක්‍රියා සිදුවීමට ඉඩ නොතබන බව වත්මන් සභාපතිවරයා සහතික විය. ඒ අනුව මේ පිළිබදව වහාම කරුණු සොයාබලා වාර්තාවක් සතියක් තුළ ඉදිරිපත් කරන ලෙසත් ලේකම්වරයාට නියෝග කළේය.

## මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අදාළ කරගැනීම පිළිබද නීතිපති උපදෙස් - ආයතනික වෙනස්කම් පිළිබද මහාභාරකරුගෙන් නිර්දේශ කැඳවයි

මෙම ආයතනයට 1973 වසරේදී රජයට පවරා ගැනීමේදී මහාභාරකරුගේ යටතට පත් කර ඇති බැවින් මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ ආයතනයට අදාළ වේද යන්න පිළිබදව අපහැදිළි තත්ත්වයක් ඇති බව නිලධාරීහු පැවසූහ.මේ පිළිබදව නීතිපතිගේ උපදෙස් ලබා ගන්නා ලෙස කමිටුව දන්වා සිටියේය.එසේම මෙම ආයතනය පාලනය කිරීම සදහා කවරනම් නීතිරීති සකස්කළ යුත්තේද යන්නත් සිදුවිය යුතු ආයතනින වෙනස්කම් මොනවාද යන්නත් දන්වා එවන ලෙස මහාභාරකරුට නිර්දේශ කළේය.

## පුවත්පත් ලිපියකට රු මිලියන 500ක වන්දියක් ගෙවීමට නියම කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවයි

සිළුමිණ පුවත්පතෙහි පළ වූ ලිපියකට අදාළව වන්දි ඉල්ලා ගොනු කළ නඩුවකදී පැමිණිලිකරුට මිලියන 500 ක වන්දියක් ගෙවීමට නියම කිරීම පිළිබදවද මෙහිදී අවධානය යොමුවිය.මෙම නඩුව 2010 වසරේදී කොළඹ දිසා අධිකරණයේ කැදවූ අවස්ථාවේදී සමාගම වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීතීඥවරයා වැරදි උසාවි කාමරයක සිටීම නිසා පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දී රු මිලියන 500ක වන්දියක් ගෙවන ලෙස අධිකරණය නියෝග කර ඇත.මේ පිළිබද මේවන විට අභියාචනා ගොනුකර ඇතිබවත් අනාවරණය විය.සමාගමේ මෙම නීතිඥවරයාට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර 2020 වසරේදී විශ්‍රාම ගෙන ඇති බව ද අනාවරණය විය.මේ සම්බන්ධ කඩිනම් නීති උපදෙස් ලබා ගෙන ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබදව සතියක් තුළ කෝප් කමිටුවට දන්වන ලෙස කෝප් සභාපතිවරයා නියෝග කළේය.

## මිලියන 14ක මූල්‍ය වංචාවක් සිදුකළ හිටපු අලෙවි ප්‍රධානියාට රු මිලියන 25 ක් පාරිතෝෂික ගෙවීම පිළිබද පුළුල් විමර්ශනයක්

ආයතනයේ හිටපු අලෙවි ප්‍රධානී ආයතනයට 2017 වසරේදී සිදු කළ මිලියන 14ක මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයකින් වැරදිකරු වුවද අවසානයේ ඔහුට පාරිතෝෂික දීමනා (gratuity) ලෙස රු මිලියන 25 කට ආසන්න මුදලක් ගෙවීම සම්බන්ධයෙන් මෙහිදී කරුණු අනාවරණය විය.මේ සම්බන්ධ විධිමත් විමර්ශනයක් සිදුකර ගනු ලබන ක්‍රියාමාර්ග සති දෙකක් තුළ දන්වන ලෙසද කමිටුව දන්වා සිටියේය.



## අගරු චෙක්පත්වලින් රු මිලියන 22 කට ආසන්න මුදලක් ලබා ගැනීමට නෛතික පියවර කඩිනම් කිරීමට උපදෙස්

අගරු චෙක්පත්වලින් රු මිලියන 22 කට ආසන්න මුදලක් ආයතනයට ලැබිය යුතු බවද මෙහිදී අනාවරණය විය.මේ සම්බන්ධයෙන් ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ග පිළිබද දැනුම් දෙන ලෙස කමිටුව උපදෙස් දුන්නේය.

මීට අමතරව විගණන ප්‍රමිතීන්ට අනුව සහ ප්‍රධාන ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණයක් සිදු නොවීම,රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සදහා ණය පදනම මත දැන්වීම් පළ කිරීමේදී වසර දෙකකට වැඩි කාලක සිට නොපියවූ ආයතන 189 ක රුමිලියන 20 කට ආසන්න හිගමුදල් ලබා ගැනීම කඩිනමින් කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිබදව ද කමිටුවේ අවධානය යොමු විය.

එසේම ප්‍රගතිය සමාලෝචනය සදහා නැවත මාස හයක කාලයකින් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම කැදවන බවද කෝප් සභාපතිවරයා පැවසීය.

# පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීම පැවැත්වේ

**▪නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කාලරාමුවක් සකස්කරන තෙක් ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත සලකාබැලීම කල් යයි**







නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) ගරු හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් රැස් වන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීම මේ මස 07 වැනිදා පැවැත්වුණි.

මෙහිදී ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීම සිදු වූ අතර කැසිනෝ සඳහා  නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කාලරාමුවක් සකස්කරන තෙක් මෙම කෙටුම්පත සලකා බැලීම සතියකින් කල් දැමීම සිදු විය.

මෙහිදී කාරක සභාවේ සභාපතිවරයා පෙන්වා දුන්නේ කැසිනෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම පිළිබඳ මින් පෙර සාකච්ඡා වූ බවත් ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් සකස් කළ කාල රාමුවකට අනුව 2023 ජනවාරි 31 වන විට මෙම නියාමන අධිකාරියට කැබිනට් අනුමතිය ගැනීමට දින සැලැස්මක් සකස් කර දුන් බවත්ය.නමුත් එය සිදු වී නොමැති බවත් මේ නිසා නව දින සැලැස්මක් අවශ්‍ය බවත් එය සකස්කිරීම සඳහා සතියක කාලසීමාවක් ලබාදෙන බවත් කමිටුව සඳහන් කළේය.මේ අනුව ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ සලකා බැලීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සතියකින් රැස්වීමට මෙහිදී තීරණය කෙරිණි.

එසේම 2021 අංක 30 දරන විසර්ජන  පනත යටතේ වන නියමය සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය ලබාදීමද මෙහිදී සිදු විය.






# පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය

පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලය සඳහා වූ පනත් කෙටුම්පතට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී එක් සංශෝධනයකට යටත්ව අනුමැතිය ලබාදීම සිදුවිය. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 13 වැනිදා රැස්වූ අවස්ථාවේදී මෙම පනත් කෙටුම්පත සලකා බැලිණි.

එහිදී අදහස් දැක්වූ කමිටු සභාපතිවරයා සඳහන් කළේ බොහෝ කලක් ප්‍රමාද වී හෝ පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලයක් පිහිටුවීම ඉතා වැදගත් පියවරක් බවයි. මෙම ක්‍රියාවලිය මගින් අයවැය විශ්ලේෂණ ක්‍රියාවලියට අතවශ්‍ය ස්වාධීනත්වය සහතික කෙරෙන බවද කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය.



**කාරක සභාව මෙහිදී පනත් කෙටුම්පතේ පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු විය**

▪අයවැය කාර්යාලයේ විෂය පථය ආර්ථික පිරිවැය සහ ආදායම් උත්පාදනය පිළිබද සිදු කරන ලද ඇගයීම් සම්බන්ධයෙන් පමණක් වීම් එනම් සමාජමය බලපෑම තක්සේරු කිරීමට එහි නෛතික බලයක් නොමැති වීම.

▪ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සහ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සභාපතිවරුන් සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකගෙන් සමන්විත උපදේශන කමිටුවක් පත් කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පාර්ලිමේන්තු අයවැය කාර්යාලය සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන් ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේදී මෙම උපදේශන කමිටුව විසින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට සහය වනු ඇත.

▪ජාතික ආර්ථික හා භෞතික සැලසුම් සමග සමගාමීව කටයුතු කිරීමට සහ අදාළ කරුණ සම්බන්ධ සංවේදී දත්ත අයවැය කාර්යාලයීය පනතට අනුකූලවම පමණක් හුවමාරු කිරීමට අයවැය කාර්යාලයට ඇති හැකියාව.

නව විධිවිධානවලට අනුව ජන්ද අපේක්ෂකයන්ට සිය ප්‍රතිපත්ති වඩාත් විනිවිදබවකින් ඉදිරිපත් කිරීමේ හැකියාව

එමෙන්ම නව පනතට අනුව පිළිගත් දේශපාලන පක්ෂ නායකයින්ට සිය පක්ෂ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශන ස්වාධීනව විශ්ලේෂණය කිරීම සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.මෙමගින් ජන්ද අපේක්ෂකයින්ට තම ප්‍රතිපත්ති ප්‍රකාශනවලට අයත් ප්‍රතිපාදන වඩා විනිවිදභාවයකින් සහ විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබේ.

ඒ අනුව සභාපතිවරයා අවධාරණය කළේ පාර්ලිමේන්තු අයවැය කාර්යාලය ව්‍යවස්ථාදායකය විසින් තහවුරු කරන ලද ස්වාධීන ආයතනයක් බවයි.එමගින් මූල්‍ය පුරෝකථන මත සිදුවිය හැකි මූල්‍ය බලපෑම පිළිබඳ විකල්ප ක්‍රමවේද භාවිතා කරමින් සිදුකරනු ලබන යෝජනා විශ්ලේෂණය කිරීම සිදුකළ හැකි බවද හෙතෙම අවධාරණය කළේය. ඒ අනුව පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අයවැය දින 60ක් ඇතුළත ඉදිරිපත් කිරීම යන සංශෝධනයට යටත්ව පනත් කෙටුම්පත සඳහා අනුමතිය හිමි විය.





# අන්තර්ජාලය ඔස්සේ සිදුකරන දෙස් විදෙස් ව්‍යාපාර නියාමනය කරන නිසි යාන්ත්‍රණයක් අත්‍යවශ්‍යයි - ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා වන කාරක සභාවේදී අවධාරණය කෙරේ



අන්තර්ජාලය ඔස්සේ සිදු කරන ව්‍යාපාරික කටයුතු, ඒවාට සම්බන්ධ සමාගම්වල බදු ගෙවීම් ආදිය නියාමනය කිරීමට තවමත් විධිමත් යාන්ත්‍රණයක් නොමැති බැවින් ඒ සඳහා කඩිනමින් පියවර ගතයුතු බව ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා වන කාරක සභාවේදී සාකච්ඡා විය.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්,ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතාගේ සභාපතිත්වයෙන් පසු ගිය 13 වැනිදා රැස්වූ අවස්ථාවේදී මේ පිළිබදව අවධානය යොමු විය.

වර්තමානයේ දක්නට ලැබෙන සේවා යෝජකයා සහ සේවා දායකයා අතර පැවතී සාම්ප්‍රදායික ශ්‍රම සේවා සැපයීමෙන් බැහැරව, ශ්‍රම ළෙඳපොළේ නිදහසේ කටයුතු කරන ශ්‍රමිකයින් (Freelancer) පිරිසකගෙන් බහුලව විවිධ ආර්ථික ක්‍රියාකාරකම් ආශ්‍රිතව කටයුතු කරමින් සිටින ආර්ථිකයක් හෙවත් ගිග් ආර්ථික තත්ත්වය (Gig economy) පිළිබද මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා විය.

අන්තර්ජාල ඔස්සේ ව්‍යාපාර සිදු කරන ඇතැම් විදේශීය සමාගම් බදු නොගෙවා විදේශයන්හි බැංකු ගිණුම් වෙත විශාල මුදල් ප්‍රමාණයක් ලබාගන්නා බව මෙහිදී අනාවරණය විය.ඒ අනුව අන්තර්ජාලය කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාපාරික කටයුතුවල නිරත වන දේශීය සමාගම් සහ ජාත්‍යන්තර සමාගම් සඳහා සම ව්‍යාපාරික පරිසරයක් ඇතිකිරීමේ අවශ්‍යතාව මෙහිදී අවධාරණය කෙරිණි.

වාණිජ බැංකු ප්‍රධානීන්□ අන්තර්ජාලය ඔස්සේ ව්‍යාපාරික කටයුතුවල නිරත දේශීය හා විදේශීය සමාගම් නියෝජිතයන්, ක්‍රෙඩිට් කාඩ් සමාගම් නියෝජිතයන්, මහ බැංකු නියෝජිතයන් ඇතුළු පිරිසක් මෙම කමිටු රැස්වීමට සහභාගී වූහ.

ගිග් ආර්ථිකය (Gig Economy) වත්මන් තාක්ෂණික සංවර්ධනයට සමගාමීව ශීඝ්‍රයෙන් වර්ධනය වන බැවින් අන්තර්ජාලය හරහා සිදුකෙරෙන ව්‍යාපාරික කටයුතු දිරිමත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී.මෙම ව්‍යාපාර නියාමනය කිරීම සඳහා නෛතික රාමුවක් මෙන්ම ඩිජිටල් සේවා බද්දක් හඳුන්වාදීම යෝග්‍ය බව ද යෝජනා විය. එසේම අන්තර්ජාල ව්‍යාපාරවලට සම්බන්ධ සමාගම් වැඩි වශයෙන් රට තුළට ආකර්ශනය කර ගැනීමට පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය බවද මෙහිදී සාකච්ඡා විය.

ආර්ථික ඩිජිටල්කරණය තුළින් පැන නගින බදු අභියෝග විසඳීම සඳහා වන කුළුණු ද්විත්වයේ විසඳුම පිළිබද ප්‍රකාශයට අනුව (G20 /OECD) සාමාජික රටවල් 140 න් ගෝලීය ආයතනික බදු ගිවිසුමට අත්සන් කර නොමැතිව ඇත්තේ ශ්‍රී ලංකාව, පාකිස්තානය, කෙන්යාව සහ නයිජීරියාව යන රටවල් හතර පමණක් බව මෙහිදී අනාවරණය විය.

ඒ සමගම මුදල් නෝට්ටු සහ කාසි වෙනුවට ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයද කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය.මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සහ නිකුත් කිරීම සඳහා වාර්ෂිකව බිලියන 32ක් වැය වන බවත් ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව සකස් කළ සැලැස්ම පිළිබඳ වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයා උපදෙස් දුන්නේය.





පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු අනුර ප්‍රියදර්ශන යාපා,ගරු මොහොමඩ් මුසම්මිල්, ගරු සංජීව එදිරිමාන්න හා ගරු ලලිත් වර්ණකුමාර යන මහත්වරු මෙම අවස්ථාවට එක්ව සිටියහ.



මේ සඳහා මහ බැංකුව, නීතිපතිදෙපාර්තමේන්තුව, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය,මුදල් අමාත්‍යාංශය,කර්මාන්ත අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් උසස් නිලධාරීන් සහභාගී වූ අතර සමාගම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් ජෙනරාල්,මහ බැංකුව,කොමර්ෂල් බැංකුව,සම්පත් බැංකුව,HNB බැංකුව,NDB බැංකුව,ලංකා බැංකුව නියෝජනය කරමින් සභාපතිවරුන්,ප්‍රධාන විධායක නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහභාගි වූහ.



එසේම මෙරට ඔන්ලයින් සේවා සපයන ආයතන නියෝජනය කරමින් Lanka Pay, Pick me, Uber, Master, Visa, Daraz a' යන ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, අධ්‍යක්ෂකවරුන් සහභාගි වූ අතර ඔවුන්ගේ අදහස් ද කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.මෙම කමිටුව පැමිණි සමාගම් රෙජිස්ටාර් ජෙනරාල්වරයා ප්‍රකාශ කළේ යම් නීතියක් මඟින් දක්වා නොමැති විට ලියාපදිංචි කරන ලෙස බල කිරීමට හෝ අනිවාර්ය කිරීමට නොහැකි බවත් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව තොරතුරු ගොනු කර තබා ගැනීමේ ආයතනයක් ලෙස ක්‍රියා කරන බවත් ය.එසේම තනි පුද්ගල සහ හවුල් ව්‍යාපාර ලියාපදිංචිය සිදු කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වන අතර තවත් ව්‍යාපාර කොටසකට පළාත් පාලන ආයතන මගින් බලපත්‍ර දෙනු ලැබේ.

# සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අමාත්‍යාංශය මැදිහත් වී ණය පහසුකම් ලබා දීමේ කටයුතු කඩිනම් කිරීමට බැංකු සමග අවශ්‍ය පියවර ගන්නවා - කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ



සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මුහුණපාන්නට සිදුව ඇති දුෂ්කරුතා මගහරවා ගැනීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් දැනට ක්‍රියාත්මක ණය පහසුකම් ලබා දීමේ කටයුතු කඩිනම් කරන ලෙස වැවිලි කර්මාන්ත සහ කර්මාන්ත අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මහතා පාර්ලිමේන්තුවේදී නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මෙසේ උපදෙස් ලබා දීම සිදුවිය.

මේ අනුව ඉදිරි සතිය තුළ බැංකු සමග සාකච්ඡා කොට ව්‍යාපෘති වාර්තා ලබා දී ඇති නිෂ්පාදන කර්මාන්තකරුවන්ට ඒ සඳහා කඩිනමින් පහසුකම් සලසන ලෙස ද අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශ ලේකම් තිලකා ජයසුන්දර මහත්මිය ඇතුළු නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

ආනයනය සීමා කිරීම හරහා මෙරට කර්මාන්තවල විශාල ප්‍රගමනයක් දැකිය හැකි බවද මෙහිදී අමාත්‍යවරයා පැවසීය.ඒ අනුව පසුගිය වසරේදී (2022) ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වන ඩො.බි. 131 ක මුදලක් ලබාගත හැකිවූ බවද ඒ මහතා පැවසීය. මෝටර් රථ සහ ත්‍රීරෝද රථ එකලස් කිරීමේ කර්මාන්තකරුවන් 22 ක් මේවන විට මෙරට තුළ කටයුතු කරන බවත් හඳුනාගත් ක්ෂේත්‍ර 20 ක් ඔස්සේ කර්මාන්ත සංවර්ධන කටයුතු සිදු කරන බවත් අමාත්‍යවරයා පැවසීය.

මැණික් හා ස්වර්ණාභරණ, මැටිකජු, වේවැල්, උණබට යනාදී විවිධ කර්මාන්ත ආශ්‍රිතව පවතින ගැටලු රැසක් මෙහිදී මන්ත්‍රීවරයන් විසින් කාරක සභාවේ අවධානයට යොමුකරන ලදී ඒ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමට ද මෙහිදී අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු නිලධාරීන්ට අමාත්‍යවරයා උපදෙස් දුන්නේය.





# පවතින සංකීර්ණ නීති වෙනුවට මෙරට ආයෝජන සම්බන්ධයෙන් නව පනතක් මේ වසර අවසන් වන විට ගෙනෙනවා - රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම

මේ වසර අවසන් වන විට මෙරට ආයෝජන සම්බන්ධයෙන් නව පනතක් සම්මත කිරීමට රජය අපේක්ෂා කරන බව ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතා පැවසීය.

මේ අනුව ලබන වසරේ සිට ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කිරීමේදී පවතින සංකීර්ණ තත්ත්වයන් ඉවත් වන බව ඔහු පෙන්වා දුන්නේය. රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී පැවති ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී ඔහු මේ බව පැවසීය.

මෙරට ආයෝජන සිදු කිරීමේදී බලපත්‍ර ලබා ගැනීම වැනි විවිධ කාරණා සම්බන්ධයෙන් පවතින සංකීර්ණ තත්ත්වයන් පිළිබඳව මන්ත්‍රීවරුන් කරුණු විමසූ අවස්ථාවේදී, ඊට ප්‍රතිචාර දක්වමින් රාජ්‍ය අමාත්‍යවරයා යෝජිත නව ආයෝජන පනත පිළිබදව සඳහන් කළේය.

තවද, ආයෝජකයින්ගේ ගැටලු විසඳීම ඇතුළු පහසුකම් සැපයීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 27 වන මහලේ ආයෝජකයන්ට පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් (Investor Facilitation Center) ආරම්භ කර ඇති බවත් එය රජයේ සියලුම ආයතනවල සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන බවත් රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය. එහිදී ආයෝජකයන්ට සිය ගැටලු ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානීන් හමුවීමටද අවස්ථාව සලසා ඇත. ආයෝජකයින්ට පවතින ගැටලු කඩිනමින් මෙම මධ්‍යස්ථානය මගින් විසඳා ගැනීමට අවස්ථාව සැලසෙන බව ඔහු පැවසීය.නව නීතිය ක්‍රියාත්මක වනතුරු තාවකාලික වැඩපිළිවෙළක් වශයෙන් මෙය ක්‍රියාත්මක බව ද ඔහු වැඩිදුරටත් පැවසීය.



එලෙසම, ශ්‍රී ලංකාවට ආයෝජන ගෙන ඒමට හැකි ආයෝජන කලාප හඳුනා ගෙන ඇති බවත් ඒවා ප්‍රවර්ධනය කර නව ආයෝජකයින් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් රාජ්‍ය අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

රට තුළට ගෙන එන ආයෝජන පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කිරීමේදී ආයෝජන සම්බන්ධයෙන් සැබෑ තොරතුරු ඉදිරිපත් කිරීමේ අත්‍යවශ්‍යතාවද මන්ත්‍රීවරයන් විසින් පෙන්වා දෙන ලදී.







# මන්ත්‍රීවරු සමග සාකච්ඡා නොකර පළාත් පාලන සීමා නිර්ණය ගැන අවසන් තීරණයක් ගන්නේ නැහැ. පළාත් පාලන මන්ත්‍රීවරු සංඛ්‍යාව අඩු කළද කිසිදු ජන කොට්ඨාසයකට අසාධාරණයක් සිදුවීමට ඉඩ තබන්නේ නැහැ. - අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සහතික වෙයි.

පළාත් පාලන මැතිවරණය සඳහා සීමා නිර්ණය කිරීමේදී මන්ත්‍රීවරු සංඛ්‍යාව අඩුකිරීම සිදුකළද කිසිදු ජන කොට්ඨාසයකට අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබන බවත්, සියලු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තුව සමග සාකච්ඡා නොකොට අවසන් තීරණයන්ට එළඹෙන්නේ නැති බවත් අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන්, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා සහතික විය.තරුණ සහ කාන්තා නියෝජනයට සාධාරණයක් වන පරිදි මෙම කටයුතු සිදුවිය යුතු බවද ඔහු පැවසිය.

මේ මස 07 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති රාජ්‍ය පරිපාලන්, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතීත්වය දරමින් අග්‍රාමාත්‍යවරයා මේ බව සඳහන් කළේය.පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු අශෝක ප්‍රියන්ත යන මහත්වරු ඇතුළු රාජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ රාජ්‍ය නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

2023 පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා බාරදුන් රාජ්‍ය සේවකයන්ට මැතිවරණය ප්‍රමාදවීම නිසා මුහුණපාන්නට සිදුව ඇති දුෂ්කරතා පිළිබඳ මෙහිදී අවධානය යොමු විය. ඔවුන් සඳහා වැටුප් ගෙවිය යුතු බවට චක්‍රලේඛනයක් නිකුත් කර තිබියදීත් ඇතැම් ආයතනවල එම කටයුතු නිසි පරිදි සිදු නොවන බවටත් මෙහිදී සාකච්ඡා විය් එසේම ඇතිවී ඇති තත්ත්වය අනුව තාවකාලික අනුයුක්ත කිරීම් සිදු කිරීමේදී මෙම සේවකයන්ට විශාල අපහසුතාවන්ට පත්වීමට සිදුව ඇති බවත් මන්ත්‍රීවරු මෙහිදී පෙන්වා දුන්හ. මෙහිදී ළගම ආයතනයට අනියුක්ත කිරීම් සිදුකිරිමට චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවද රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා පැවසීය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා ලෙස අග්‍රාමාත්‍යවරයා උපදෙස් දුන්නේය.

මෙම තත්තවය වෙනස් කිරීම සඳහා අවශ්‍යමය නීතිමය සංශෝධනය ගෙනඒමට පියවර ගන්නා ලෙස ද මන්ත්‍රීවරයන් විසින් මෙහිදී ඉල්ලීමක් කරන ලදී නොඑසේ නම් නම් පාර්ලිමේන්තුව මගින් නාමයෝජනා අහෝසි කිරීම සඳහා යෝජනාවක් සම්මත කිරීම සඳහා වන යෝජනාවක් ද මෙහිදී ඉදිරිපත් විය.



ක්ෂේත්‍ර නිලධාරීන්ට තම මැතිවරණ බල ප්‍රදේශය තුළ ඡන්දය ඉල්ලීමට පවතින බාධා ඉවත් කිරීම සඳහා සකස් කළ පනත් කෙටුම්පතෙහි කටයුතු පිළිබඳව ද කමිටුවේ අවධානය යොමු විය.ඒ අනුව පනත් කෙටුම්පත නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති බවත් නිලධාරීහු පැවසූහ.ඒ අනුව ඒ සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ගෙන පනත් කෙටුම්පතෙහි කටයුතු අවසන් කිරීමට අග්‍රාමාත්‍යවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

පළාත් පාලන ආයතන කොමසාරිස්වරුන් යටතේ මේවන විට පළාත් පාලන ආයතන පාලනය වන බැවින් මහජනතාව වෙනුවෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මැදිහත් වීමේ අවශ්‍යතාව මන්ත්‍රීවරු පෙන්වා දුන්හ.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් හරහා මහජන ගැටලු විසඳීමේ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා පළාත් ආණ්ඩුකාරවරුන්ට උපදෙස් ලබාදීමට පියවරගන්නා බව රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා මෙහිදී පැවසීය.



තිස්සමහාරාම හිටපු ප්‍රාදේශීය ලේකම්වරිය මාධ්‍යයට පවසා ඇති කරුණු සම්බන්ධයෙන්ධයෙන්ද මෙහිදී කරුණු සාකච්ඡා විය.මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක ව වාර්තාවක් කැඳවූ බවත් පෞද්ගලික හේතුවක් මත කැමැත්තෙන් ස්ථානමාරුවක් ඉල්ලා ඇති බවට ලිපියක් ද ලැබුණු බවත් අනාවරණය විය.මෙවැනි ප්‍රකාශයක් නිකුත් කිරීම සාධාරණ නොවන බවත් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ක්‍රියාත්මක කරන බවත් අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී පැවසීය.



වේයන්ගොඩ ප්‍රාදේශීය සභාව ඇතුළු ප්‍රාදේශීය සභා නගරසභා බවට පත්කිරීමේ කටයුතු පිළිබඳව ද මෙහිදී අග්‍රාමාත්‍යවරයාගේ අවධානය යොමුවිය.මෙවැනි ඉල්ලීම් 85 ක් මේ වන විට පවතින බවත් හෙළිවිය. ඒ අනුව එම කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය උපදෙස් අග්‍රාමාත්‍යවරයා විසින් ලබා දෙන ලදී.



2020 වසරේ උපාධිධාරී අභ්‍යාසලාභී වැඩසටහන යටතේ සුදුසුකම් ලද උපාධිධාරීන්ට පත්වීම් ලබා දීමේ වැඩසටහනේදී මෙම ක්‍රියාවලියේ පැවති අඩුපාඩු හේතුවෙන් ස්ථිර පත්වීම් ලබා දී නොමැති පිරිස ස්ථිර කිරීම පිළිබඳව විපක්ෂනායකවරයා කාරක සභාවේ අවධානයට යොමු කළේය.ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව, අගමැති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් සමාලෝචන කමිටුවෙන් නිර්දේශ කර ඇති බව නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ.ඒ අනුව එම කටයුතු කඩිනම් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දුන්නේය.



රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කර ඇති 30,000 කට ආසන්න බහු කාර්ය දෙපාර්තමේන්තු සේවකයින්, දැනට සිටින ස්ථානවල ම සේවයේ යෙදවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සොයාබලන බවත්, ඔවුන්ගේ වැටුප පවා ඉහළ තලයකට පත්වන බවත් අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කියා සිටියේය.

තවද පළාත් පාලන ආයතනවල වසර ගණනාවත් සේවය කළ පිරිස ස්ථිර කිරීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කරන ලදී.දැනට මෙවැනි සේවකයන් 9700ක් සිටින බවත් ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කරන බවත් රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා පැවසීය.



# ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ විශේෂ ඒකකයක් පිහිටුවීමට පියවර -අධ්‍යපන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කෙරේ

### මෙරට පෞද්ගලික උපකාරක පන්ති ගුරුවන් සඳහා ඉගැන්වීමේ බලපත්‍රයක් ලබා දීමටද යෝජනා



ජාත්‍යන්තර පාසැල් පිළිබඳව කටයුතු කිරීමට හා ඒවා පිළිබඳ අධීක්ෂණය සහ නියාමනය කිරීම පිණිස විශේෂ ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පිහිටු වීමට අධ්‍යපන කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා වී තිබේ මේ සබැඳිව දැනට පවතින නීති රාමුව කාලීන අවශ්‍යතාවයන් අනුව සංශෝධනය විය යුතු බවත්, මෙහිදී අනාවරණය විය.

අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරකව මේ මස 08 වැනි දා එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) වී රාධක්‍රිෂ්ණන් මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේ දී රැස්විය.

එහිදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසැල් පිළිබඳවත්, එම පාසැල් පද්ධතිය මඟින් සිසු දරුවන්ට ලබා දෙන අධ්‍යාපනය හා එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කෙරුණි.
තවද මෙම පාසැල් පද්ධතිය තුළ අධ්‍යාපනය ලබන සිසු දරුවන්ගේ අයිතීන් පිළිබඳව ද මෙහිදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කෙරුණි.

තවද,ජාත්‍යන්තර පාසැල් සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නොපවතින අනෙකුත් පාසැල් නියාමනය කිරීම සඳහා අවශ්‍ය නිර්නායක ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (National EducationCommission)විසින් සකස් කරමින් පවතින බවත් මෙහිදී අනාවරණය විය.

ගුරු මාරුවීම් මෙන්ම ගුරු උපදේශක සේවයේ (In service Advisors) පවතින ගැටළු පිළිබඳව ද කාරක සභාවේ දී කරුණු සාකච්ඡා කරන ලද අතර,ඒකී ගැටළු නිරාකරණයකිරීමට ගත යුතු පියවර කඩිනමින් ගන්නා ලෙස කාරක සභාවේ සභාපතිවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

තවද, රජයේ පාසැල්වල පවතින ගුරු හිඟය පිළිබඳවත් මෙහිදී කාරක සභාවේ අවධානයට යොමු වූ අතර,ඉංග්‍රීසි මාධ්‍ය හා උසස් පෙළ පංති සඳහා ගුරුවරුන්ගේ හිඟයක් පවතින බැව් මෙහිදී කරුණු අනාවරණය විය. ඒ අනුව, සිසු දරුවන්ගේ අඛණ්ඩ අධ්‍යාපනයට බාධාවක්ව පවතින මෙම ගුරු හිඟය මඟ හරවා ගැනීම පිණිස අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා ලෙසද කාරක සභාවේ සභාපතිවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

දිවයින පුරා පුද්ගලික උපකාරක පංති පවත්වන පුද්ගලික ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර එම ගුරුවරුන්ගේ සුදුසුකම් හා ගුණාත්මකභාවය පිළිබඳව සමාජය තුළ පවතින කතිකාවත පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු විය. ඒ අනුව, පුද්ගලික ගුරුවරුන් නියාමනයකට යටත් කොට ඔවුනගේ වෘත්තිය සඳහා නිසි පිළිගැනීමක් ඇති කොට දීම වඩාත් සුදුසු බැව් කාරක සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත නිර්දේශ කරන ලදී.

වෙනත් රටවල පුද්ගලික ගුරුවන් සඳහා බලපත්‍රයක් (“Teaching License”) ලබා දී එම වෘත්තිය සඳහා වෘත්තීය පිළිගැනීමක් ලබා දී ඇති බව කරුණු අනාවරණය වී ඇති බැවින්, එවැනි ක්‍රමවේදයක් ශ්‍රී ලංකාව තුළද අනුගමනය කිරීම වඩාත් උචිත බව කාරක සභාව විසින් වැඩිදුරටත් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.



# මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ

ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් මාන්නප්පෙරුම මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 06 වැනිදා රැස්වූ පරිසරය, ස්වභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරිණි.

මෙම කාරක සභා රැස්වීමේ ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ව්‍යාපාරික සංගම් නියෝජිතයින් සහභාගී වූ අතර මෙහිදී ඔවුන් විසින් මුහුණ දෙන ගැටලු ඉදිරිපත් කරන ලදී.

මේ අනුව මෙරට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය අවධාරණය කෙරුණු අතර ව්‍යාපාරික සංගමයක් විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තියකට අදාළ යෝජනාවලියක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව සියලු පාර්ශවකරුවන්ගේ එකගත්වයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට ඉදිරි පියවර ගන්නා ලෙස කාරක සභාවේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මහතා උපදෙස් ලබා දුන්නේය.

මෙම රැස්වීමට සහභාගි වූ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා සඳහන් කලේ, මෙම ක්ෂේත්‍රයේ ඇති ගැටලු මැණික් පතල් කැණීම, මැණික් කැපීම, ඔපදැමීම සහ අගය වැඩිකිරීම, ආනයනය අපනයනය ඇතුළු වැළඳ කටයුතු, වෙළඳ ප්‍රවර්ධනය ආදී අංශ යටතේ වර්ගීකරණය කර අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් සහ යෝජනා ඇතුළත් පුළුල් වාර්තාවක් සකස් කර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මුදල් අමාත්‍යාංශය සහ අදාළ අංශවල අවධානයට එය යොමු කළ යුතු බවයි.





එමෙන්ම මැණික් පතල් කැණීම් සඳහා බලපත්‍ර ලබා ගැනීමේදී පවතින දුෂ්කරතා පිළිබඳව ද පැමිණි නියෝජිතයින් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී බලපත්‍ර නිකුත් කිරීම සඳහා අදාළ සියලුම ආයතන සතියකට එක් දිනයක් හෝ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයට පැමිණ ඒකාබද්ධව බලපත්‍ර නිකුත් කිරීම මගින් එම ක්‍රියාවලිය කාර්යක්ෂම කළ හැකි බව කාරක සභාව විසින් මෙහිදී අවධාරණය කරන ලදී.

මේ අතර, රත්‍රං ආනයනය තහනම් කිරීම හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තයේ නිරත වන ව්‍යාපාරිකයන් පීඩාවට පත්ව සිටින බව පැමිණි නියෝජිතයෝ පෙන්වා දුන්හ. විදේශ මුදලින් පමණක් ගණුදෙනු කරන මෙම ව්‍යාපාරිකයන් අතිවිශාල විදේශ විනිමය ප්‍රමාණයක් මෙරටට ගෙන එන බවත් තමන් උපයන විදේශ විනිමයෙන් කොටසක් යොදවා රත්‍රං ආනයනය කිරීමට අවසර දෙන ලෙසත් ඔවුහු ඉල්ලා සිටියහ.මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා රජය විසින් පනවා ඇති බදු හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යාපාරිකයන් පීඩාවට පත්ව සිටින බව ද ප්‍රකාශ කරන ලදී ඒ අනුව මෙම කරුණු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කරන බව කාරක සභාවේ සභාපතිවරයා පැවසීය.

එමෙන්ම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට පිවිසෙන ශ්‍රමික පිරිස අඩුවීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට භාජනය විය මෙම ව්‍යාපාරය පදනම් වූ ප්‍රදේශවල පුහුණු ආයතන පිහිටුවීම සහ මෙම ක්ෂේත්‍රය ප්‍රචලිත කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය මන්ත්‍රීවරු සහ පැමිණ සිටි නියෝජිතයෝ මෙහිදී පෙන්වා දුන්හ.

# නැනෝ යූරියා පොහොර භාවිතය මගින් නිර්දේශිත යූරියා පොහොර ප්‍රමාණය 25%-50% අතර ප්‍රමාණයකින් අඩු කරගත හැකියි - ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය වෙයි

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් නැනෝ තාක්ෂණය භාවිතා කර දියුණු කර ඇති නැනෝ යූරියා නොහොත් ' HA- Urea ' නමින් හඳුන්වන පොහොර නිෂ්පාදනය භාවිතය මගින් නිර්දේශ කර ඇති යූරියා පොහොර ප්‍රමාණයෙන් 25-50% අතර ප්‍රමාණයක් අඩු කරගත හැකිවන බවත්□ අස්වැන්න 10% කින් වර්ධනය කරගත හැකි බවත් සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRDI) හා තේ පර්යේෂණ ආයතනය (TRI) ආයතන විසින් සිදුකර ඇති පර්යේෂණ මගින් තහවුරු වී ඇති බව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් දැනුම් දුන්නේය.

මේ අදහස් ඉදිරිපත් වුයේ ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී වීරසිංහ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය. ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික මූලික අධ්‍යයන ආයතනය සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය මෙම මෙම රැස්වීමට කැඳවා තිබිණි.

මේ සඳහා පේටන්ට් බලපත්‍ර 3 ක් සහ ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් නිෂ්පාදන බලපත්‍රයක් ලබා දී ඇති බවද නිලධාරීන් විසින් දැනුම් දෙන ලදී.නැනෝ යූරියා වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සකස් කිරීම, අළෙවි අනුමැතිය හා නිර්දේශ ලබාදීමේ ක්‍රියාදාමය අදාල ආයතන විසින් කඩිනමින් සිදු කරන ලෙසට කාරක සභාව විසින් මෙහිදී උපදෙස් ලබා දෙන ලදී.



ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් පසෙහි සාරවත්භාවය රැකගැනීම හා බෝග පෝෂණ කළමනාකරණය සඳහා පාංශු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්ව යේ වැදගත්කම පිලිබඳ කරුණු ඉදිරිපත් කළ අතර සිය ආයතනය විසින් හඳුන්වා දී ඇති ජෛව පටල ජෛව පොහොර වර්ගය භාවිතයෙන් අස්වැන්න 20% - 30% ත් අතර ප්‍රමාණයකින් වැඩි කළ හැකි බවද මෙහිදී අනාවරණය විය මේ වන විට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතව නිෂ්පාදනය කරනු ලබන මෙම පොහොර ගොවීන් වෙත බෙදාහරින බවද නිලධාරීන් සඳහන් කළහ. එමෙන්ම මේ වන විට මෙම පොහොර භාවිතා කිරීම තුළින් භාවිතා කළ යුතු රසායනික පොහොර අඩු කර අස්වැන්න වැඩි වීම නිසා රටට ආර්ථික වශයෙන් බිලියන 10 ක පමණ මුදලක් හිමිකර දී ඇති බවද ඔවුහු පේනවා දුන්හ.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් කාබනික පොහොර සඳහා පවතින පොහොර ප්‍රමිතීන් සහ වෙළඳපොළට හඳුන්වා දෙන ලද විවිධ කාබනික පොහොර නිෂ්පාදන සඳහා නව ප්‍රමිතීන් නිර්දේශ කිරීම පිලිබඳවද කරුණු විය.මේ වනවිට කාබනික පොහොර වර්ග 06 ක් සඳහා ප්‍රමිතීන් සම්පාදනය කර ඇති බව සහ ඊට අමතරව ජෛව පොහොර සඳහා ප්‍රමිතීන් සකස් කර ජාතික ප්‍රමිතියක් ලෙස ජුනි මස අවසානයේදී ප්‍රකාශයට පත් කළ හැකි බවටත් සාකච්ඡා කෙරිණි.





# ඉතිහාසයේ ප්‍රථම වතාවට පෞද්ගලික අංශය ද අල්ලස් ගැනීමේ වරදක් සිදු කළහොත් දූෂණ මර්දන පනත් කෙටුම්පත යටතේ දඬුවම්ලබා දිය හැකියි - යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා වෙයි



දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාල අල්ලස් දූෂණ සහ පිළිබඳ චෝදනා සහ ඒ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීම  සඳහා ද අදාල අල්ලස් දූෂණ වැරදි සඳහා නඩු පැවරීම සදහා ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු කර්තව්‍යයන් සඳහා වන දූෂණ විරෝධි පනත පිළිබදව අද පැවති යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ජා විය.

දූෂණ මර්දන පනත් කෙටුම්පතට, පෞද්ගලික අංශය විසින් ද අල්ලස් ගැනීම  වරදක් බවට පත්කිරීමේ විධිවිධාන ඇතුළත් බවත්, එය මීට පෙර රාජ්‍ය ආයතනවලට පමණක් සීමා වූ බවත් මෙහිදී සාකච්ජා විය.ඒ අනුව, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ 5 වැනි වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයක් එකී පනත් කෙටුම්පත යටතේ යම් වරදක් සිදු කිරීම මත වරදකරු බවට පත් කිරීමට හැකියාව හිමිවේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්ලිව්ඩීජේ සෙනෙවිරත්න මහතාගේ  ප්‍රධානත්වයෙන් මේ මස 20 වැනිදා පාර්ලිමේන්තුවේ පැවති යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මෙම කරුණු  සාකච්ජා විය.

තවද, පොලිස් නිලධාරීන්ට පමණක් සීමා නොවී විමර්ශන කටයුතු සඳහා නිශ්චිත ක්ෂේත්‍රවලින් විශේෂඥයින් බඳවා ගැනීමේ විධිවිධාන ද පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබේ.

කාරක සභාවේ සාමාජිකයින්ගේ අදහස වූයේ පනත් කෙටුම්පතේ අරමුණු වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා ඇතැම් විධිවිධාන සංශෝධන කිරීම අවශ්‍ය බවය.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම පාලනයේ විනිවිදභාවය ඉහළ නැංවීම සහ පාලනයේ අවංකබව ශක්තිමත් කිරීම සහ වගවීම වැඩි කිරීම සඳහා අල්ලස හා දූෂණය තුරන් කිරීම දූෂණ විරෝධී පනත් කෙටුම්පතේ අරමුණු වේ.

තවද ආණ්ඩුව පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය කිරීම සහ දූෂණය තුරන් කිරීම සඳහා වන මහජන සහභාගිත්වය ශක්තිමත් කිරීම, මේ පනත යටතේ බලතල සහ කාර්යය ක්‍රියාත්මක කිරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම, අල්ලස් දූෂණ වත්කම් සහ බැරකම් ප්‍රකාශ වලට අදාලව වැරදි පිළිබඳ මූලික පරීක්ෂණ සහ විමර්ශන කටයුතු සිදු කිරීමට සහ ඒවාට එරෙහිව නඩු පැවරීමට ඉහත කී කොමිෂන් සභාවට නියෝග කිරීම, අල්ලස් හා දූෂණ වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනය ක්‍රියාකාරකම් පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම, රාජ්‍ය නිලධාරීන් අයථා ලෙස ධනවත් වීම වැළැක්වීම පිණිස වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සඳහා සඵලදායි ක්‍රමයක් හඳුන්වා දීම මෙමගින් අපේක්ෂා කෙරේ.





# වාහන ආනයනය නැවතීම ඇතුළු භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන් අයවැයෙන් අපේක්ෂාකරන ආදායමට ලගාවීමට ශ්‍රී ලංකා රේගුවට නොහැකියි - ශ්‍රී ලංකා රේගුව

- ▪වාහන ආනයනය සම්බන්ධයෙන් ආණ්ඩුව කඩිනම් තීරණයක් ගන්නවා - කාරක සභාවේ සභාපති මහින්දානන්ද අලුත්ගමගේ මහතා
- ▪කොපමණ මැණික් ප්‍රමාණයක් උවද රේගුවෙන් නිදහස් කිරීමට අවශ්‍යවන්නේ ඩොලර් 200 ක් පමණක් බව හෙලිවෙයි
- ▪රේගු නඩුවක් අවසන් කිරීමට නිශ්චිත කාලසීමාවක් නොමැතිවීම පිළිබඳ අවධානය
- ▪බහාලුම් පරීක්ෂාකිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් අවධානය
- ▪ගුවන්තොටුපොළ සේවයේ නියුතු රේගු නිලධාරීන් පරීක්ෂාවන්ට යටත් නොකිරීම සම්බන්ධයෙන් අවධානය

වාහන ආනයනය නැවතීම ඇතුළු භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් හේතුවෙන් මෙම වසරේ අයවැයෙන් අපේක්ෂාකරන ආදායම ලගාවීමට ශ්‍රී ලංකා රේගුවට නොහැකි බව ශ්‍රී ලංකා රේගු නිලධාරීන් ජාතික ආර්ථිකය හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පැවසීය.

ශ්‍රී ලංකා රේගු නිලධාරීන් මේ බව පැවසුවේ රාජ්‍ය ආදායම වැඩිකරගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට ලබාදියහැකි දායකත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ජාතික ආර්ථිකය හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසුවේ මේ වසරේ අයවැයෙන් ශ්‍රී ලංකා රේගුවේ ආදායම ලෙස රුපියල් බිලියන 1226ක් බලාපෙරොත්තු වන බවත් මෙම මාස 5 තුළ තවමත් ලබාගෙන ඇත්තේ රුපියල් බිලියන 330 පමණක් බවත්ය.මේ නිසා මෙම අයවැයෙන් බලාපොරොත්තු වන ආදායමට ලගාවීමේ ගැටලුවක් පවතින බවයි.

මේ අනුව පැමිණ සිටි නිලධාරීන් පැවසුවේ වාහන ආනයනය ඇතුළු ආනයන සීමා පවතින තෙක් මෙම බලාපොරොත්තු වන ආදායමට ලගා විය නොහැකි බවයි. මේ තත්ත්වය යටතේ මෙම වසර තුළ ලබාගතහැකි ආදායම ලෙස ඔවුන් පුරෝකථනය කරනනේ රුපියල් බිලියන 783 ක් බවයි මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශයද දැනුවත් කොට ඇති බව එම නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ.

එසේම රේගුවෙට ලැබෙන ආදායමෙන් 20% ක් පමණ ලැබෙන්නේ වාහන ආනයනයේදී පනවන බදු නිසාවෙන් බවත් වාහන ආනයනය සම්බන්ධයෙන් ඇති සීමා පවතින තෙක් මෙම බලාපොරොත්තු වන ආදායමට ලගාවිය නොහැකි බවත් ඔවුහු දත්ත සහිතව පෙන්වා දුන්හ. එසේම 2014 වර්ෂයේ සිට 2022 කාලසීමාව ආශ්‍රිතව වැඩිම බදු ආදායම් ලබාගෙන ඇත්තේ 2018 වර්ෂයේදී බවත් එම බදු මුදල රුපියල් බිලියන 923ක් බවත් මෙහිදී නිලධාරීහු පැවසූහ.මේ අනුව මෙම ආදායමෙන් රුපියල් බිලියන 194ක් ලැබී ඇත්තේ වාහන ආනයනයේදී පනවා ඇති බදු වලින් බවද මෙහිදී සඳහන් විය. මේ නිසා වසර 3 පමණ කාලසීමාවක සිට වාහන ආනයනය සීමාවී ඇති බැවින් රේගුවේ ආදායම අඩු වී ඇති බවත් මේ මස සිට වාහන ආනයනයට අවසර දෙන්නේ නම් ඉදිරි මාස 6 ඇතුළත රුපියල් බිලියන 150ක් වාහන ආනයනයේදී බදු ලෙස ලබාගත හැකි බවත් ඔවුහු පෙන්වා දුන්හ.



මේ නිසා ණය අදාර ක්‍රමයක් යටතේ (Credit line) වෙනත් රටක් සමග සම්බන්ධවී වාහන ආනයනය කිරීමේ හැකියාව පිළිබඳවත් එය මෙරට පවතින විදේශ මුදල් විදෙස්ගත නොවී රේගු ආදායම වැඩි කරගැනීමට හොදම ක්‍රමය බවත් නිලධාරීහු පෙන්වා දුන්හ. විශේෂයෙන්ම රේගුවේ යෝජනා ඉටු වුවහොත් රුපියල් බිලියන 1100 පමණ ආදායමකට ලගාවිය හැකි බවද මෙහිදී නිලධාරීන් සදහන් කළේය.



මේ අනුව කාරක සභාවේ සභාපතිවරයා පැවසුවේ මේ පිළිබඳ දැනටමත් සාකච්ඡා ආරම්භ වී ඇති බැවින් වාහන ආනයනය සම්බන්ධයෙන් ආණ්ඩුව කඩිනම් තීරණයක් ගැනීමට කටයුතු කරන බවයි.

එසේම මැණික් සහ රත්‍රන් ආනයනයේදී සහ අපනයනයේදී ලබාගන්නා බදු මුදල් පිළිබඳවද මෙහිදී වධානය යොමු විය.මේ අනුව නිලධාරීන් පෙන්වා දුන්නේ 2012 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයකට අනුව කොපමණ මැණික් ප්‍රමාණයක් උවද රේගුවෙන් නිදහස් කර ගැනීමට අයකළ හැක්කේ ඩොලර් 200 ක් පමණක් බවයී මේ නිසා 2012 වර්ෂයට පෙර පැවති තක්සේරු මුදල මත බදු අයකරගැනීමේ ක්‍රමය යලි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීහු ඉල්ලා සිටියහ.

තවද රේගුව විසින් පනවන නඩුවක් අවසන් කිරීමට නිශ්චිත කාලසීමාවක් නොමැතිවීම පිළිබඳ අවධානය යොමු වූ අතර කාරක සභාවේ සභාපතිවරයා සඳහන් කළේ අධිකරණ ඇමතිවරයා සමග හැකි ඉක්මනින් සාකච්ඡා කොට මේ සඳහා ක්‍රමවේදයක් සකස් කරන බවයි.මෙහිදී අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් වරාය පර්යන්තයේ බහාලුම් 1200 ක් පමණ වසර කිහිපයක සිට රඳවා ඇති බවද සඳහන් විය.

එසේම බහාලුම් පරීක්ෂාකිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන්ද දීර්ඝ ලෙස සාකච්ඡා වූ අතර මෙහිදී සඳහන් වූයේ ආනයනික භාණ්ඩ වලින් 60% පමණ පිටතට ගෙනයන්නේ ග්‍රීන් ඒරියා කොටසෙන් බවයි.මෙහිදී මේවා පරීක්ෂාවීමක් සිදු නොවන බවත් සීනි, පොහොරි, හාල් වැනි දේ මෙසේ ගෙන්වන බවත් සඳහන් විය.නමුත් මෙහිදී මෙම භාණ්ඩ අතර සඟවමින් සිගරට්, මත් පැන් වැනිදේ ගෙන්වීම සිදු වන බවද නිලධාරීන් පෙන්වා දුන්නේය.

ගුවන්තොටුපොළ සේවයේ නියුතු රේගු නිලධාරීන් පරීක්ෂාවන්ට යටත් නොකිරීම නිසා විශාල වංචා සිදු වන බවට තොරතුරු ලැබී ඇති බව මෙහිදී කාරක සභාවේ සභාපතිවරයා පෙන්වා දුන්නේය.මේ අනුව මේ පිළිබඳ පරීක්ෂාකර බලා රේගු නිලධාරීන් පරීක්ෂාකිරීමට අවසර ලබාදෙමින් නියෝගයක් නිකුත් කිරීමට රේගුව කටයුතු කරන බව නිලධාරීන් පැවසීය.

තවද රේගුවේ ආදායම වැඩිකරගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව අතර සම්බන්ධතාව වැඩි කිරීමට තාක්ෂණික ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවද මෙහිදී රේගු නිලධාරීන් පෙන්වා දුන්නේය.









# මහා පරිමාණ මත්පැන් නිෂ්පාදන සමාගම්වලින් අය විය යුතු බදු මුදල් අයකරගැනීමට ඉක්මනින් කටයුතු කරන්න - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

- මත්පැන් නිෂ්පාදනාගාරවලදී සෑම මත්පැන් බෝතලයකටම ස්ටිකරයන් අලවන්නේදැයි පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සකස්කිරීමට උපදෙසි
- සුරාබදු දෙපාර්තමේන්තුවේ කටයුතු ඩිජිටල්කරණය කිරීමට උපදෙස්
- මත්පැන් නිෂ්පාදනාගාරවල සේවය කරන සුරාබදු දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් කාලානුරූපීව හුවමාරු කිරීමට උපදෙස්
- සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්‍යක්ෂමතාව වැඩිකරගැනීමට අවශ්‍ය අතරමග නැවතී ඇති නීති සහ රෙගුලාසි පිළිබඳ මෙම කමිටුවට දැනුවත් කිරීමට උපදෙස්




මහා පරිමාණ මත්පැන් නිෂ්පාදන සමාගම්වලින් අය විය යුතු බදු මුදල් අයකරගැනීමට ඉක්මනින් කටයුතු කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.


පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම උපදෙස් ලබා දුන්නේ ජාතික ආර්ථිකය හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව ඒ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 22 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පෙන්වා දුන්නේ මෙම වසරේ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 217 ක් බවත් ජුනි මස වන විට උපයා ඇත්තේ රුපියල් බිලියන 72985 පමණක් බවත්ය.මේ නිසා බලාපොරොත්තු වන ආදායමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ලගාවී නැති බව හෙතෙම පැවසීය.

මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ මත් පැන් මිල ඉහළ යාම හේතුවෙන් මත්පැන් නිෂ්පාදනය සහ අලෙවිය අවම වී ඇත් බවයි.මේ නිසා බලාපොරොත්තු වන ආදායමට ලගාවිය නොහැකි බව එම නිලධාරීන් දත්ත සහිතව පෙන්වා දුන්නේය.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසුවේ වසර කිහිපයක සිටම සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම වැඩි වී නැති බවයි මේ නිසා මත් පැන් මිල වැඩිවීම හේතුවෙන් පමණක් ආදායම අවම වී ඇති බව නිරීක්ෂණය නොවන බවයි. එබැවින් මෙරට පවතින මහා පරිමාණ මත්පැන් නිෂ්පාදන සමාගම්වලින් නිවැදිව බදු අයකරගැනීමට කටයුතු කරන ලෙසයි යම් ආකාරයකින් බදු ගෙවීම පැහැර හරින නිෂ්පාදන සමාගම් වල බලපත්‍ර අහෝසි කිරීමටද ඒ මහතා උපදෙස් ලබාදුන්නේය.

එසේම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණය වීමේ අවශ්‍යතාවද අලුත්ගමගේ මහතා පෙන්වා දුන්නේය. මෙහිදී මෙම ආයතනය වසර 110 අතීතයක් සහිත ආයතනයක් බවත් තවමත් මෙම ආයතනය ඩිජිටල්කරණය නොවීම දුර්වලතාවක් බවත් ඒ මහතා පෙන්වා දුන්නේය.



මත්පැන් නිෂ්පාදනාගාරවලදී සෑම මත්පැන් බෝතලයකටම ස්ටිකරයන් අලවන්නේදැයි පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් සකස්කිරීමටද මෙහිදී කාරක සභාව උපදෙස් ලබාදුන්නේය. මෙහිදී සඳහන් වූයේ ස්ටිකර් රහිතව මත්පැන් බෝතල් වෙළඳ පොළට නිකුත් වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය වන බවයි මේ නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නිසි වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස කමිටුව නිලධාරීන්ට උපදෙස් ලබාදුන්නේය. එසේම ස්ටිකරය රහිතව මත්පැන් අලෙවිකරන මත්පැන් අලෙවිසැල් වල මත් පැන් බලපත්‍රය අහෝසි කිරීමට අවශ්‍ය කටයුතු ගන්නා ලෙසද අලුත්ගමගේ මහතා උපදෙස් දුන්නේය. තවද මත්පැන් නිෂ්පාදනාගාරවලට ලබාදෙන මුඩි ප්‍රමාණය සහ නිෂ්පාදනාගාරවලින් බෙදාහරින් බෝතල් ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාකොට අක්‍රමිකතාවන් සිදු වන්නේ නම් ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමටද උපදෙස් ලබාදුන්නේය.

එසේම මත්පැන් නිෂ්පාදනාගාරවල සේවයේ සිටින සුරාබදු දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් දීර්ඝකාලීනව එම සමාගම්වල සේවයේ සිටින නිසා දූෂණ සහ අක්‍රමිකතා සිදු වන බවට නිරීක්ෂණය වන බවත් මේ නිසා මෙම නිලධාරීන් කාලානුරූපීව හුවමාරු කිරීමට ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් මහින්දානන්ද අලුත්ගමගේ මහතා උපදෙස් ලබාදුන්නේය.

සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යකසෂමතාව වැඩිකරගැනීමට අවශ්‍ය,අතරමග නැවතී ඇති නීති සහ රෙගුලාසි මෙම කමිටුවට දැනුවත් කිරීමටත් කාරක සභාවේ සභාපතිවරයා උපදෙස් ලබාදුන්නේය.

මේ අනුව මෙම සාකච්ඡා කළ කරුණුවලට අදාළව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම වැඩිකර ගැනීමට අවශ්‍ය සැලසුම් දක්වමින් සති දෙකක් ඇතුළත මෙම කමිටුවට වාර්තාවක් ලබාදීමට මෙම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා නිර්දේශ කළේය.












# රාජ්‍ය ආයතන අකාර්යක්ෂම වීම වළක්වා ගැනීම සහ රාජ්‍ය ආයතන හා ජනතාව අතර ඇති දුරස්ථභාවය තුරන් කිරීම පිළිබඳ විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ



රාජ්‍ය ආයතන අකාර්යක්ෂම වීම වළක්වා ගැනීම සහ රාජ්‍ය ආයතන හා ජනතාව අතර ඇති දුරස්ථභාවය තුරන් කිරීම පිළිබඳ විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි ඒ මෙම කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතාගේ සභාපතිත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මහජනයා සමග ඍජුව සම්බන්ධ වන, මහජන ගැටලුණී අවශ්‍යතා විශාල වශයෙන් ඉටු කළ හැකි හා දුක්ගැනවිලි විශාල ප්‍රමාණයක් පවතින වැදගත් වූ රාජ්‍ය ආයතනයන්හි කාර්යභාරය සමාලෝචනය කිරීමට සහ ඒවාට මඟ පෙන්වමින් හා අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් සැකසීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම රැස්වීම කැඳවා තිබිණි.

මේ සඳහා හිටපු ජනාධිපති ලේකම් උදය සෙනවිරත්න□ හිටපු ආයුර්වේද කොමසාරිස් ආචාර්ය ගාමිණී කාරියවසම්, හිටපු  ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සුනිල් එදිරිසිංහ,කාර්මික සංවර්ධන මණ්ඩල සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් සන්ධ්‍යා විජේබණ්ඩාර, හිටපු අමාත්‍යාංශ ලේකම් සිරිපාල විරිතමුල්ල, හිටපු ආගමන විගමන පාලක ජනරාල් සරත් රූපසිරි හා හිටපු දිස්ත්‍රික් ලේකම් සුනිල් කන්නංගර යන මහත්ම මහත්මීන් කැඳවා තිබිණි.

රාජ්‍ය ආයතන අකාර්යක්ෂම වීම වළක්වා ගැනීම සහ රාජ්‍ය ආයතන හා ජනතාව අතර ඇති දුරස්ථභාවය තුරන් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය. ප්‍රාදේශීය වශයෙන් ග්‍රාමීය නායකයින් එනම් විහාරාධිපති හිමිවරු ඇතුළු අනෙකුත් ආගමික නායකයින්, ග්‍රාම සේවක, විශ්‍රාමික විදුහල්පතිවරු, ඇතුළු තවත් ප්‍රාදේශීය වශයෙන් සිටින නායකයින් හා පොලිසිය සම්බන්ධ කරමින් සංවිධානයක් පිහිටුවා ප්‍රාදේශීය වශයෙන් පවතින ගැටලු සාකච්ඡා කිරීමට හා ඒවාට විසඳුම් සොයා ගැනීමට යොදා ගැනීම වඩාත් වැදගත් බව මෙහිදී අවධාරණය විය.

එමෙන්ම 2019දී කැබිනට් අනුමතිය යටතේ ක්‍රියාත්මක වූ "ගම සුරැකුම"  වැඩසටහන පිළිබඳ අදහස් කාරක සභාවට ඉදිරිපත් වූ අතර එය මේ වන විට අකර්මණ්‍ය වී ඇති බැවින්, එම වැඩසටහනට අදාල යෝජනාව කාරක සභාවට ඉදිරිපත් කරන මෙන් කාරක සභාවේ සභාපතිවරයා විසින් විද්වත් මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදි.

මීට අමතරව, පරිපාලනයට අදාල නීති රීති පැවතියද එම නීති රීති නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවීම ගැටලු සහගත වන අතර එම ක්‍රියාවලිය නිසියාකාරයෙන් පවත්වා ගනිමින් හා එහි ක්‍රියාකාරීත්වය සක්‍රීය ආකාරයෙන් අධීක්ෂණය කිරීම වැදගත් බවද  විද්වත් මණ්ඩලය විසින් පෙන්වා දෙන ලදී.



# පාසැල් දරුවන් වෙනුවෙන් විද්‍යුත් තැපෑල (E-mail) ගිණුම් සැකසීමේදී දෙමවුපියන්ගේ දත්ත ඇතුළත් කරන්න එපා - පොලිස් අපරාධ අංශයේ නිලධාරීහු පාර්ලිමේන්තු කාරක සභාවේදී පවසති

■ජංගම දුරකථන මිලදී ගැනීමේදී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ලියාපදිංචිය සහිත ජංගම දුරකථන මිලදීගන්න - ශ්‍රී ලංකා පොලීසිය

පාසැල් දරුවන් වෙනුවෙන් විද්‍යුත් තැපෑල (E-mail) ගිණුම් සැකසීමේදී දෙමවුපියන්ගේ දත්ත ඇතුළත් නොකරන ලෙසත් දරුවන්ගේ නිවැරදි වයස ඇතුළු දත්ත ඇතුළත් කරන ලෙසත් පොලිස් අපරාධ අංශයේ උසස් නිලධාරීන් ප්‍රතිසංධානය සහ ජාතික සමගිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා වේදී පැවසීය.

මෙහිදී එම නිලධාරීන් පෙන්වා දුන්නේ පසුගිය කාලසීමාව තුළ මාර්ග ගත අධ්‍යාපනය ප්‍රචලිත වීම හේතුවෙන් දරුවන් සඳහා ජංගම දුරකථන (Smart Phone active) ඇතුළු පරිගණක උපාංග භාවිත කිරීමට ලබාදීම සිදු වූ බවයි.නමුත් එසේ ස්මාර්ට් ජංගම දුරකථන ලබාදීමේදී සහ විද්‍යුත් තැපෑල ආරම්භ කිරීමේදී දෙමවුපියන්ගේ දත්ත මේ සඳහා ලබාදීම නිසා දරුවන්ට ඕනෑම වෙබ් අඩවියකට පිවිසීමට අවස්ථාව ලැබෙන බව මෙහිදී ඔවුහු පෙන්වා දුන්හ.එසේ නොමැතිව දරුවන්ගේ නිවැරදි වයස ඇතුළු තොරතුරු ලබාදීම සිදු කරන්නේ නම් අන්තර්ජාල පද්ධතිය විසින්ම දරුවන්ට නුසුදුසු දර්ශන සහ වෙබ් අඩවි සොයාබැලීමේ හැකියාව සහ ප්‍රවේශය පාලනය කිරීම සිදු කරන බව පැවසීය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ ජාතික සංහිඳියාව හා ළමා හා කාන්තා කාර්යංශය සම්බන්ධව සිදු කරන වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා කිරීමට ප්‍රතිසංධානය සහ ජාතික සමගිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මේ මස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.



එසේම දුරකථන භාවිතයේදී එම දුරකථන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අනුමත දුරකථනයක්දැයි පරීක්ෂා කිරීම වැදගත් බවද මෙහිදී පැවසීය.එනම් යම් කිසි අපරාධමය ක්‍රියාවකට එම දුරකථන යොදා ගතහොත් ඒ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීමේ හැකියාව මෙම දුරකථන සතුව පවතින බවයි.එනම් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ලියාපදිංචි කළ ජංගම දුරකතන තුළට සිම් පතක් ඇතුළත් කළ විට ඒ සම්බන්ධ තොරතුරු මෙම කොමිෂන් සභාවට ලැබෙන බවයි.ඒ නිසා ජංගම දුරකථන මිලදී ගැනීමේදී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ලියාපදිංචිය සහිත ජංගම දුරකථන මිලදීගන්නා ලෙස මෙහිදී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමද සිදු කළේය.

තවද පොලීසිය විසින් ජාතික සංහිඳියාව හා ළමා හා කාන්තා කාරයංශය සම්බන්ධව සිදු කරන වැඩපිළිවෙළ පිළිබඳවද පුළුල් ලෙස මෙහිදී සාකච්ඡාවට ලක් කරන ලදී.





# පාර්ලිමේන්තු ඡායා ගැලරිය















# පාර්ලිමේන්තුව සැකෙවින්

## 2023 ජුනි



මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**ජුනි 6 අඟහරුවාදා**

● "දූෂණ විරෝධී" සහ "පළාත් සභා මැතිවරණ (සංශෝධන)" නමැති පනත්කෙටුම්පත් ද්විත්වය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ පාර්ලිමේන්තුවට වෙන් වෙන් වශයෙන් දැනුම් දීම.

● පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල සහ 2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒපිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂකාරක සභාවේ යෝජනාව තවදුරටත් සංශෝධනය කිරීම.

**ජුනි 8 බ්‍රහස්පතින්දා**

● රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳවනිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂකාරක සභාව අනුමත කිරීම.

**ජුනි 9 සිකුරාදා**

● පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම

● මතු සඳහන් පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාද කිරීම සිදු විය:-
ගරු චමින්ද විජේසිරි මහතා-"රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම;
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා"වගා හානි සිදු කරන රිලවුන් ගහනය පාලනය කිරීම;
ගරු කිංස් නෙල්සන් මහතා-"සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්සවිබල ගැන්වීම; සහ
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය-"දරුවන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සම්බන්ධ වැඩසටහනක් පාසල් මට්ටමින් ප්‍රචලිත කිරීම

**ජුනි 20 අඟහරුවාදා**

● පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීම

● බලපිටිය ශ්‍රී රාහුලාරාම පුරාණ විහාරස්ථ සාමණේර ආකල්ප සංවර්ධන භික්ෂුවිද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත දෙවැනිවර කියවා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම

ජුනි 21 බදාදා

● "දූෂණ විරෝධී" සහ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" පනත් කෙටුම්පත් ද්විත්වය දෙවැනිවර කියවීම විවාදකර ඉදිරි දිනකට කල්තැබීම

● සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධන රහිතව පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීම

● 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව 2023 ජුනි 17 දිනැති අංක 2336/78 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ජනාධිපතිවරයා විසින් පළ කරන ලද ප්‍රකාශනය අනුමත කිරීම

ජුනි 22 බ්‍රහස්පතින්දා

● ගරු ජනාධිපතිතුමා විසින් 2023 ජුනි 01 වැනි දින ජාතිය අමතා කරන ලද කථාව පිළිබඳ කල්තැබීමේ විවාදය පැවැත්වීම

ජුනි 23 සිකුරාදා

● අභාවප්‍රාප්ත ගරු ලැරීන් පෙරේරා (මහත්මිය), ගරු රෙජිනෝල්ඩ් කුරේ, ගරු බුද්ධික කුරුකුලරත්න සහ ගරු මුතු සිවලිංගම් යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ශෝක යෝජනා ඉදිරිපත් කරනු ලැබීම


# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I පුවත් හසුන I 36 වැනි කාණ්ඩය 2023 ජුනි

ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka